# 6. මසාදිරුෂ් ෂරීආ

## 6.1 අල් හදීස්

- ඉස්ලාම් ආගමේ දෙවන මූලාශ්‍රය වනුයේ "හදීස්" ය.
- හදීස් යනු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ ප්‍රකාශ, ක්‍රියා හා එතුමා අනුමත කළ ඒවා ය.
- මුල සිට ම ඒවා හොඳින් සංරක්ෂණය කරනු ලැබ ඇත.
- හදීස් ක්ෂේත්‍රය සඳහා සේවය කළ ඉමාම්වරු මහඟු කර්තව්‍යයක් ඉටුකර ඇත.
- හදීස් එක්රැස් කර ග්‍රන්ථාරූඪ කළ ඉමාම්වරුන්, "මුහද්දිසීන්" යනුවෙන් හඳුන්වනු ලැබේ.
- අල් කුර්ආනයට විස්තර විචාරයක් වශයෙන් අල් හදීස් පවතී.

ඉස්ලාමීය මුලාශ්‍රයන් අතර පළමුවන හා දෙවන ස්ථානය දෙනු ලබන්නේ පිළිවෙලින් අල්කුර්ආනයට සහ අල් හදීස්වලට ය.

" හදීස්" නමැති අරාබි වචනයේ තේරුම "ප්‍රවෘත්ති" නැතහොත් "සිද්ධි" යනුවෙන් භාෂා ප්‍රවීණයෝ පෙන්වා දෙති. "සුන්නා" යන තවත් අරාබි වචනයක් ද " හදීස්" සම්බන්ධයෙන් භාවිතා කරති. කෙසේ වෙතත් මේ වචන දෙක අතර පැහැදිලි වෙනසක් තිබෙන බව ඇතැම්හු පෙන්වා දෙති. ඒ අනුව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා, මුවින් පැවසු දේ "හදීස්" බවත්, එතුමන් විසින් කරන ලද ක්‍රියාවන් සියල්ල "සුන්නා" බවත් පැවසිය හැක.

මේ අදහස සුළු වශයෙන් වෙනස් කරමින්, "රසූලුල්ලාහි සල්ලල්ලාහු අලයිහි තුමන්ගේ මුවින් පිටවූ, ක්‍රියාවෙන් පෙන්වූ සහ එතුමන් අනුමත කළ සියලු ම කරුණු හදීස්" බව කියන තවත් අර්ථ කථනයක් ද ඇත. අරාබි වචන වලින් මේ අංශ තුන කෞලි, ෆිඅලි, තක්රීරී යන නම් වලින් හැඳින් වේ.

හදීස් යන වචනයට මීටත් වඩා පුළුල් අර්ථයක් දෙන තවත් නිර්වචනයක් ද ඇත. එම නිර්වචනයට අනුව, නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමන් විසින්,

කරන ලද ප්‍රකාශයන්
කරන ලද ක්‍රියාවන්
දෙන ලද විධානයන්
ලියන ලද ලියුම්
ගිවිස ගත් ගිවිසුම් සහ
අනුමත කිරීම් මගින් දක් වූ සෑම කරුණක්ම "හදීස්" වන්නේය.

තවද කුර්ආනයේ සඳහන් වන "හික්මත්" යන වචනය හදීස් බව ඉමාම් ෂාෆිඊ රහ්මතුල්ලාහි අලෛහි තුමා පෙන්වා දෙමින්, පහත සඳහන් වාක්‍යය කුර්ආනයෙන්

උපුටා දක්වයි : "ඔබේ නිවෙස් වලදී පාරායනය කරනු ලබන ශුද්ධ වූ වාක්‍යයන් හා හික්මත් ඔබ ක්‍රියාත්මක කරනු" (අල් කුර්ආන්)

අරාබි සාහිත්‍යයේ "හික්මත්" යන වචනයේ තේරුම "දැනුම" නොහොත් "ඥානය" යන්නයි. ඒ අනුව කුර්ආනයට විස්තර විචාර ලියන තෆ්සීර් ලේඛකවරු, ඉහත දැක්වූ කුර්ආන් වාක්‍යයේ "ශුද්ධ වූ වාක්‍ය" කුර්ආනය බවත්, "හික්මත් " යනුවෙන් සඳහන් වනුයේ හදීස් බවත් පවසති.

හදීස් යන්නට ඉහත කී නම් වලට අමතරව "හබර්" යන නමක් ද දක්වයි. ප්‍රවෘත්තිය සහ ඉතිහාසය යන දෙකම "හබර්" යන වචනයෙන් හැඳින්වේ. විශේෂයෙන් නබි තුමාගේ හදීස්වල සඳහන් වන්නා වූ ඓතිහාසික සිද්ධීන් "හබර්" යන නමින් හඳුන්වනු ලැබේ.

මේ ආකාරයෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ මුළු ජීවිතයම හදීස්, සුන්නා, හික්මත් සහ හබර් යනාදී විවිධ නම් වලින් හැඳින්වෙන බව පැහැදිලි වේ.

එපමණක් නොව, "හදීස්" යනු කුර්ආනයේ විස්තර විචාරය කිරීමක් ලෙස ද දැක්විය හැක. ඉතා ගැඹුරු වූත්, සූක්ෂම වූත් බොහෝ කරුණු කුර්ආනයේ අන්තර්ගතව ඇත. එම කරුණු පහසුවෙන් තේරුම් කර ගත නොහැකි ය. එවැනි කරුණුවලට පැහැදිලි විස්තරයක් හෝ සරල අර්ථ නිරූපණයක් ලබා ගැනීමට ඉවහල් වන්නේ "හදීස් " යයි පැවසුවොත් එය නිවැරදි ය. මේ අදහස මුල් කොට ගෙන ඉමාම් ෂාෆිඊ රහ්මතුල්ලාහි අලෛහි)තුමන් හදීස්වල අන්තර්ගතය පිළිබඳව පවසා ඇත්තේ පහත සඳහන් අයුරින් ය.

1. අල්කුර්ආනයෙහි සඳහන් කරුණුමයි හදීස් වලත් සඳහන් වන්නේ.
2. කුර්ආනය මගින් ඍජු ලෙස දක්වා ඇති, පහසුවෙන් තේරුම් කරගත නොහැකි කරුණුවලට පැහැදිලි අවබෝධය ලබා දෙන්නේ හදීස් ය.
3. කුර්ආනයෙහි යම් යම් කරුණු ඉතා සූක්ෂම අන්දමින් දක්වා ඇත. ඒවා නිසි ලෙස තේරුම්ගැනීමට අධික දැනුමක් හා පුළුල් ඥානයත් අවශ්‍යයි. එහෙත් හදීස් මගින් ඒවා පහසු ලෙස තේරුම් කර ගත හැක.

අල්කුරානයෙන් පොදු වශයෙන් සඳහන් කල සමහර දේවල් අල්හදීස් හි ස්ථිරව සඳහන් ඇත.

මුහම්මද් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමන් මෙලොව ජීවත් වූ ආකාරය හා එතුමන්ගේ මග පෙන්වීම් සියල්ල පිළිපැදීම සෑම මුස්ලිම්වරුන්ට ම අනිවාර්යය බව පහත සඳහන් කුර්ආන් වාක්‍යය මගින් තහවුරු කෙරේ.

"නියත වශයෙන් ම රසූල්ට අවනත වන්නෝ අල්ලාහ්ට ද අවනත වන්නෝ ය" (4:80)

රසූලුල්ලාහ් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමන්ව ආදර්ශයට ගෙන ජීවත්වීමේ වැදගත්කම පෙන්වා දෙන වාක්‍ය කුර්ආනයේ බොහෝ තැන්වල දක්නට ඇත. හස්රත් ආයිෂා රලියල්ලාහු අන්හා තුමිය පවසන අන්දමට "නබිතුමන්ගේ ජීවිතය ම කුර්ආනය විය". එනිසා එතුමා ගේ ජීවන රටාවට හා එතුමන්ගේ හදීස්වලට අනුව ජීවත් වන සෑම " මුඃමින් " වරයෙක් ම කුර්ආනයට අනුව ජීවත් වූ කෙනෙකු හැටියට අල්ලාහ්තආලාගේ සැලකිල්ලටත් ප්‍රසාදයටත් ලක්වනු ඇත."

## හදීස් එක්රැස් කිරීමේ හා ග්‍රන්ථාරූඪ කිරීමේ ඉතිහාසය

- අල්කුර්ආනය මෙන්ම හදීස් ද නිසි ලෙස ආරක්ෂා කරන ලදී.
- විවිධ හේතූන් මත මෙයට අන්තර් සහදතා ඇති වී හානි සිදුවුණි.
- හදීසය ලේඛන ගත කර ආරක්ෂා කිරීමෙහි ලා ඉමාම්වරුන්ගේ දායකත්වය අති විශිෂ්ට ය.

ඉස්ලාමීය නීති මූලාශ්‍රයේ දෙවැන්න ලෙස සැලකෙන මෙය "සුන්නා"යනුවෙන් ද හඳුන්වයි. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ ප්‍රකාශයන්, ක්‍රියාවන් අනුමැතීන් හා ලක්ෂණ යනාදී සියල්ලක් ම මෙයට ඇතුළත් වේ. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ව සම්පූර්ණයෙන් ම අනුගමනය කළ එතුමාණන්ගේ සගයෝ ඉහත සඳහන් කළ සෑම කරුණක් ම දැන සිටියහ. පසුව එය වාර්තා කරන්නන් ලෙස ද සිටියහ. එසේ වාර්තා කරන්නන් රාවි වරුන් ලෙස හැඳින්වේ.

අල්කුර්ආනය පහළවෙමින් තිබුණු මුල් අවධියේ හදීසයන් සහාබාවරුන්ගේ මනසෙහි හා ක්‍රියාවෙහි පමණක් දක්නට තිබුණි. එය ලේඛන ගත කිරීම තුළින් අල්කුර්ආනය සමඟ මිශ්‍ර විය හැකි ය; යන බියක් ද එවකට තිබුණි. තවද ලිවීමේ හැකියාව තිබෙන අය ද බොහෝම ස්වල්පය. මෙවැනි හේතූන් මුල්කරගෙන හදීසය ලේඛනගත නොකරන ලෙස නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා උපදෙස් දුන්නේ ය. නමුත් මෙම බිය නැති වූ පසු හදීසය ලේඛනගත කිරීමට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා අවසර දුන්නේය.

එවකට "හදීස්" කටපාඩම් කළ අයගෙන් ආයිෂා රලියල්ලාහු අන්හා තුමිය හා අබූ හුරයිරා රලියල්ලාහු අන්හු තුමා යන අය සැලකිය යුතු අය වෙති. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ වියොවීමෙන් අනතුරුව ඇතිවුනු දේශපාලනික හේතූන් හා ජනතාව යහ ක්‍රියාවන් සඳහා පෙළඹවීමට සමහරුන් විසින් ගත් උත්සහය නිසා ඉස්ලාමීය විරෝධී ආයතනවල සැලසුම්ගත ක්‍රියාවන් ද හදීස් යන නමින් ව්‍යාජව නිර්මාණය කරන ලද ඒවා ද ඇතුළත් වීමට හේතු විය.

එක් එක් පක්ෂයට අයත් අය තමන්ට අවශ්‍යවන ආකාරයෙන් හදීස් නිර්මාණය කළෝ ය. ආගමික ක්‍රියාවන්ට යොමු කිරීම සඳහා සමහරු හදීස් නිර්මාණය කළෝ ය. මෙලෙස සත්‍ය හදීසය සමඟ ව්‍යාජ ඒවාද මිශ්‍ර විය. ඒ සමඟම හදීසය කටපාඩම් කළ උතුම් සහාබාවරුන් ගේ මරණය ද උමෙයියා පාලකයා වන උමර් ඉබ්නු අබ්දුල් අසීස් තුමාගේ අවධානයට යොමු විය.

සත්‍ය ඒවාද ව්‍යාජ ඒවාද වෙන්කර ලිවීමේ වැදගත්කම පිළිබඳව දැනගත් කලීෆා තුමා හදීසය නිසි ලෙස එක්රැස් කරන මෙන් අණ කළේ ය. ඒ සඳහා ඉමාම්වරු පත්කර සිය පාලනයට යටත්ව තිබුණු නගරවලට දෙන ලද අණ මත හදීසයන් එක්රැස් කරනු ලැබිණි. හිජ්රි 1 වන සියවසෙහි ආරම්භ වුණු මෙම උත්සාහය මඟින් අද අප අතර දක්නට තිබෙන්නා වූ හදීස් ග්‍රන්ථ බිහි විය. මෙසේ හදීස් එක් රැස් කිරීම සඳහා එවකට ජීවත් වූ විද්වතුන් හා ඉමාම්වරුන් ඉතා උනන්දු විය. සත්‍ය හා අසත්‍ය හදීසය හඳුනාගෙන සිය ග්‍රන්ථ ලේඛන කර ගත්හ. මේ සඳහා විවිධ දුෂ්කරතාවලට ද ඔවුනට මුහුණ දීමට සිදු විය. දීර්ඝ ගමන්වල යෙදීමට ද සිදු විය. එපමණක් නොව හදිස් වාර්තාකරුවන්ට තිබිය යුතු ලක්ෂණ පිළිබඳව ද වෙන වෙන ම පර්යේෂණවල යෙදුනහ. මෙවැනි මහඟු කර්තව්‍යයන් හි ප්‍රතිඵලයක් ලෙස සත්‍ය හදීස් ග්‍රන්ථ 6 එළි දැක්විණි. මෙය "අස්සිහාහුස් සිත්තා" (කුතුබුස් සිත්තා) යනුවෙන් හැඳින්වේ. මෙම ග්‍රන්ථයන් පිළිබඳව ද අපගේ අවධානය යොමු කරමු.

## මුහද්දිසීන් හය දෙනා සහ හදීස් වියතුන් පිළිබඳ විස්තර

| හැඳින්වූ නම | මුල් නම | පියාගේ නම | උපන් ගම | උපන් වර්ෂය හිජ්රි | නැසීගිය වර්ෂය හිජ්රි | ලියූ ප්‍රධාන ග්‍රන්ථය |
|---|---|---|---|---|---|---|
| ඉමාම් බුහාරි | මුහම්මද් | ඉස්මායිල් | බුහාරා (රුසියාව) | 194 | 256 | සහීහුල් බුහාරි |
| ඉමාම් මුස්ලිම් | මුස්ලිම් | හජ්ජාජ් | නයිසාපූර් | 204 | 261 | සහීහ් මුස්ලිම් |
| ඉමාම් අබූ දවුද් | සුලෙයිමාන් | අෂ් අස් | සජිස්තාන් | 201 | 275 | සුනන් අබීදාවුද් |
| ඉමාම් තිර්මිදි | මුහම්මද් | ඊසා | තිර්මිද් | 209 | 279 | ජාමිඋත් තිර්මිදී |
| ඉමාම් නසාඊ | අහ්මද් | ශුඅයිබ් | කුරාසාන්හි නසාඃ නමැති ගම | 215 | 303 | සුනනුන් නසාඊ |
| ඉමාම් ඉබ්නු මාජා | මුහම්මද් | යසිද් | කස්වින් | 209 | 273 | සුනන් ඉබ්නු මාජා |

## අභ්‍යාස

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

(1) "හදීස්" යන්නෙහි තේරුම කුමක් ද?
(2) "සුන්නා" යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද?
(3) ඉමාම් ෂාෆිඊ රහ්මතුල්ලාහි අලෛහි තුමා හදීස්වල අන්තර්ගතය ගැන කෙසේ පැවසුවේ ද?
(4) හදීස් ග්‍රන්ථාරූඪ කිරීමේ ඉතිහාසය කෙටියෙන් දක්වන්න.
(5) "සිහාහුස් සිත්තා" (කුතුබුස් සිත්තා) යන්නෙහි තේරුම පැහැදිලි කරන්න.

## හදිස් වියතුන් පිළිබඳ ඓතිහාසික තොරතුරු

### I ඉමාම් බුහාරි (රහ්මතුල්ලාහි අලෛහි)

හිජ්රි දෙවන ශත වර්ෂයේ අගභාගයේ දී, එනම් හිජ්රි 194 වර්ෂයේ රුසියාවේ බුහාරා නම් නගරයේ ඉමාම් බුහාරි රහ්මතුල්ලාහි අලෛහි උපත ලැබූහ. එතුමාගේ ළමා වියේදී ම පියාණන්ගේ අභාවය සිදු විය. එසේ වුවද ළමා වියේ දී පවා එතුමා යහපත් ගති ගුණවලින් සපිරි කෙනෙක් පමණක් නොව එතුමාගේ බුද්ධි වර්ධනයද ඉහල මට්ටමක පැවතුණි.

කාය ශක්තිය සමග මතක ශක්තියත් ඉගෙනීමෙහි අසීමිත උනන්දුවකුත් එතුමා සතුව තිබූ අතර මුල සිට ම "හදීස් කලාව", කෙරෙහි විශේෂ ලැදියාවක් දැක්විය. වයස 14 දී පටන් "හදීස්" අධ්‍යයනයෙහි නිරත වෙමින් 20 වන වියේදී තමන්ට ලැබූ හදිස් සියල්ල එක් රැස්කිරීම ආරම්භ කළේ ය.

තරුණවියේ දී තම මෑණියන් සමඟ මක්කා නගරයට ගොස් හජ් වගකීම ඉටුකර ඉන්පසු එහිදි හදීස් කලාව හැදෑරීමෙහි නිරත විය. හදීස් එක්රැස් කිරීමේ අරමුණින් විවිධ රටවල සංචාරයේ යෙදුනේ ය. කුබා, බස්රා, බග්දාද්, සිරියා වැනි ප්‍රදේශවල නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේ හදීස් රැස්කිරීමේ කාර්යයේ නිරත වූහ. හදීස් සොයා ඇවිදීමේ සංචාරය පුරා අවුරුදු 40 ක් තිස්සේ සිදු විය. නබි තුමාගේ මුවින් පිට වූ මුතු වදන්, එම නියම වචන වලින් ම ලබාගැනීම සඳහා ඉමාම් බුහාරි රහ්මතුල්ලාහි අලෛහි තුමන් අසීරු මෙහෙවරක් ඉටු කළහ. කිසිකෙනෙකුගේ අනුග්‍රහයක් නොමැතිව සිය වියදමෙන් ම මේ සංචාරවල යෙදීම එතුමාගේ උදාර චේතනාව පිළිබිඹු කරයි.

බුහාරි ඉමාම් තුමා හදිස් රැස්කිරීමේදී සෑම හදීසයක් ම වඩාත් පිරිසිදු හා සත්‍ය ඒවා විය යුතු බවට ඉතාමත් විමසිලිමත් විය. තමන්ට ලැබෙන එක් එක් හදීසය ගැන දීර්ඝ ලෙස සොයාබලා තහවුරු කරගෙන පමණක් එය ග්‍රන්ථාරූඪ කළේය. වාර්තා කරුවන් සම්බන්ධයෙන් අල්ප මාත්‍රයක සැකයක් පහල වූ වහාම එම හදීසය ප්‍රතික්ෂේප කළේ ය.

ප්‍රථමයෙන් නීතිය හැදෑරූ ඉමාම් තුමා පසුව හදීස් කලාව ඉස්හාක් ඉබ්නු රාහවයිහි, අලී ඉබ්නු මදීනී අහ්මද් ඉබුනු හන්බල් වැනි මහාචාර්ය වරුන්ගෙන් ඉගෙන ගත්තේ ය.

වරක් ඉමාම් බුහාරි රහ්මතුල්ලාහි අලෛහි **බෑග්ඩෑඩ්** නගරයට පැමිණි අවස්ථාවක දී එහි විසූ මුහද්දිසින්වරු කිහිප දෙනෙක් මෙතුමාගේ හදිස් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමට කල්පනා කළහ. ඒ අනුව තම සිසුන් 10 දෙනෙකු ලවා ප්‍රසිද්ධ ස්ථානයකදී එක් ශිෂ්‍යයෙකු විසින් හදීස් 10 බැගින් එහි වාර්තාකරුවන්ගේ නම් සියල්ල වෙනස් කොට ඉමාම් තුමා වෙත ඉදිරිපත් කරන ලදි. පසුව ඉමාම් බුහාරි රහ්මතුල්ලාහි අලෛහි තුමා සිසුන් 10 දෙනා ඉදිරිපත් කළ හදිස් 100 ම පෙරළා කට පාඩමෙන් කියවා එක් එක් හදිස්වල

රාවිවරුන්ගේ නම්ද නිවැරදි ලෙස ප්‍රකාශ කළ විට රැස්ව සිටි සියල්ලෝ ම විස්මයට පත් වූහ.

වසර 40 ක් තිස්සේ විවිධ ප්‍රදේශවලින් සොයා ගත් හදීස් සියල්ල වර්ග කිරීමෙන් පසුව ඒවා ග්‍රන්ථාරූඪ කිරීම ආරම්භ කළේය. අවසානයේදී වසර 16 ක පරිශ්‍රමයේ ප්‍රතිඵලයක් වශයෙන් "සහීහුල් බුහාරි" නම් හදීස් ග්‍රන්ථය ලොවට ලබා දුන්නේ ය.

එයින් නොනැවතී බුහාරා හි හදිස් පන්ති පවත්වා සිසුන්ට ඉගැන්වීම ආරම්භ කළේය. එතුමාගෙන් හදීස් පිළිබඳව අධ්‍යාපනය ලැබූ සිසුන් සංඛ්‍යාව 90,000 ටත් අධික ය. ඉමාම් තිර්මීදි, ඉමාම් නසාඊ, ඉමාම් මුස්ලිම් වැනි සුප්‍රසිද්ධ හදිස් වියත්තු ද මේ සිසුන් අතර වූහ.

හදීසයක් තම ග්‍රන්ථයට ඇතුළත් කිරීමට පෙර රකාඅත් දෙකක් යාඥාකර අල්ලාහ් තආලාගෙන් ප්‍රාර්ථනා කිරිම ඉමාම් බුහාරි රහ්මතුල්ලාහි අලෛහි තුමාගේ සිරිතක් විය. ඒ අවස්ථාවේ එතුමාගේ ප්‍රාර්ථනාව වූයේ, "මේ හදීස්වලට රසූලුල්ලාහ් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ සත්‍ය වූ හදිසය හැර අන් කිසිවක් එකතු නොවේවා!" යන්නයි, ඒ තරමට බිය භක්තියෙන් හා පවිත්‍ර චේතනාවෙන් යුතුවයි, ඉමාම් තුමා තම අගනා ග්‍රන්ථය සම්පූර්ණ කළේ. දේශපාලනයෙන් වැලකී එයින් දුරස්ථව ජීවත් වුව ද සෙසු ඉමාම්වරුන්ට සිදුවූවා මෙන් බුහාරි ඉමාම් තුමාට ද දේශපාලන බලපෑම්වලට මුහුණපාන්නට සිදු විය. එවකට බුහාරාහි අමීර් පදවිය දැරූ කාලිද් ඉබ්නු අහ්මද් නැමැත්තා බුහාරි ඉමාම් තුමාට එතුමාගේ ග්‍රන්ථය රාජ්‍ය සභාවේ දී කියවා ඉදිරිපත් කරන ලෙස අණ කළේ ය. ඉමාම් තුමා ඊට එකඟ නොවීම නිසා අමීර් තම සෙබළුන් බුහාරි ඉමාම්ගේ පාසලට යවා ඔවුන් ලවා ඉමාම් තුමාට අවමන් කෙරෙවුවේය. මේ සිද්ධියෙන් පසුව ඉමාම් බුහාරි රහ්මතුල්ලාහි අලෛහි සමර්කන්ද් නම් නගරය බලා පිටත්ව යන අතරතුර දී හිජ්රි 256 වර්ෂයේ අභාවප්‍රාප්ත වූහ.

උතුම් ගතිගුණවලින් ද, දැනුමෙන් ද උසස් වූ බුහාරි ඉමාම් තුමන්ගේ නාමය ලොව තිබෙන තුරු නොමැකෙන ආකාරයට එතුමන්ගේ "සහිහුල් බුහාරි" ග්‍රන්ථය වැදගත් ස්ථානයක් උසුලයි.

## සහිහුල් බුහාරි

ඉමාම් බුහාරි රහ්මතුල්ලාහි අලයිහි තුමා ප්‍රථමයෙන් රචනා කළ "අත්තාරිකුල් කබීර්" නම් ග්‍රන්ථය සහබාවරුන් සහ තාබිඊන් වරුන්ගේ උතුම් ගතිගුණ හා ඔවුන්ගේ මතිමතාන්තර වලින් සමන්විත එකකි. නමුත් "සහිහුල් බුහාරි " නම් එතුමන්ගේ ග්‍රන්ථයේ අන්තර්ගතය වන්නේ මුහම්මද් තුමාගේ හදීස් පමණකි. ඉමාම් බුහාරි රහ්මතුල්ලාහි අලෛහි තුමා හදිස් කලාව හදාරමින් සිටි වකවානුවේ, එක් අවස්ථාවක දී එතුමාගේ ගුරුතුමා වන ඉස්හාක් ඉබ්නු රාහවයිහි විසින් සත්‍ය වූ හදීස් පමණක් ඇතුළත් ග්‍රන්ථයක් සකස් කිරීමේ වගකීම බාරගන්නේ කවුරුන්දැයි ප්‍රශ්නයක් මතු කරන ලදී. එවිට එම

අභියෝගය භාරගන්න ඉමාම් බුහාරි තුමා අධිෂ්ඨානය කර ගෙන ඒ අනුව හදීස් එක් රැස් කිරීම ආරම්භ කළ බව කියවේ. එහෙත් ඉමාම් තුමා නබි තුමන්ව සිහිනයෙන් දැකීමේ ප්‍රතිඵලයක් වශයෙන් හදිස් එක් රැස් කිරීමේ කාර්යයේ නිරත වූ බව සමහරුන්ගේ මතයයි.

ඉමාම් බුහාරි රහ්මතුල්ලාහි අලෛහි තුමන් තමාට ලැබූ ලක්ෂ 06 ක් තරම් විශාල හදීස් සංඛ්‍යාවකින් ඒවා ඉතා තියුණු ලෙස පරීක්ෂාකරමින් හදීස් දස දහසක් පමණක් තෝරා ගත්තේ ය. නියමිත නිර්ණායකයන් ඔස්සේ ඒවා තව දුරටත් පරීක්ෂාකර අවසානයේ දී මුළුමනින් ම සත්‍ය හා නිවැරදි වූ හදිස් 7275 ක් තේරුම් කළේ ය. මෙසේ තේරුම් කළ ඒවා පසුව විවිධ මාතෘකා යටතේ ගොනු කර ඒ අනුව "සහිහුල් බුහාරි" නම් වූ ග්‍රන්ථය සකස් කළේ ය.

මේ ග්‍රන්ථය ලිවීම ශුද්ධ වූ කෘබාවේ දී ආරම්භ කළ බවත් එය සම්පූර්ණ කිරීමෙන් පසුව මදීනා නගරයේ නබි තුමාගේ රව්ළාවත් මිම්බරයත් අතර තබා තුන් වතාවක් හරි වැරදි බැලූ බවත් කියා ඇත. තම ආචාර්ය වරුන් වූ අහ්මද් ඉබ්නු හන්බල් සහ යහ්යා ඉබ්නු මුර්න් නම් පඬිතුමන්ලා වෙත තම ග්‍රන්ථය පිරිනමා එතුමන්ගේ ආශිර්වාදය හා අනුමැතිය ලබාගෙන ග්‍රන්ථය එළි දැක්වීය.

සෑම පරිච්ඡේදයක ම මුල දී අන්තර්ගත කරුණුවලට අදළ වූ කුර්ආන් වාක්‍ය කිහිපයක් උපුටා දැක්වීම, "කුර්ආනය" සහ "සුන්නා" යන මූලාශ්‍ර දෙක එකිනෙකට සම්බන්ධ කිරීමක් වශයෙන් මෙන් ම, සුන්නා මගින් කුර්ආනයට අර්ථ නිරූපණයක් ලබාදීමක් දක්නට ලැබේ.

කොටස් 97 කින් සමන්විත මෙම ග්‍රන්ථයේ පරිච්ඡේද 1000 කටත් වැඩිය ඇත. හදීස් ග්‍රන්ථවලින් මුල්තැන ගන්නා මෙම ග්‍රන්ථය, කුර්ආනයට දෙවන ස්ථානයේ තබා සලකනු ලැබේ. මුස්ලිම් ලෝකයේ විශ්වාසයට පාත්‍ර වූ මෙම "හදිස්" ග්‍රන්ථයට විචාර ග්‍රන්ථ 50 කට වඩා ලියවී ඇත. "ෆත්හුල් බාරි" ඒවායින් එකකි. සහිහුල් බුහාරි ග්‍රන්ථය ලොව පුරා සියයකටත් වැඩි භාෂාවලට පරිවර්තනය කර ඇත.

**ක්‍රියාකාරකම්**

1. බුහාරි ඉමාම් තුමාගේ ශිෂ්‍යයන් නම් කරන්න.
2. හදීස් ග්‍රන්ථාරූඪ කිරීමෙහි ඉමාම් බුහාරි රහ්මතුල්ලාහි අලෛහි කටයුතු කළ ආකාරය පිළිවෙළින් විස්තර කරන්න.

## II ඉමාම් මුස්ලිම් රහ්මතුල්ලාහි අලෛහි

හදීස් වියතුන් අතර දෙවන ස්ථානය හිමිවනුයේ ඉමාම් මුස්ලිම් රහ්මතුල්ලාහි අලෛහි තුමන්ට ය. අබුල් හුසෙයින් මුස්ලිම් යන නමින් හිජ්රි 204 වර්ෂයේ නෛසාපුර් ප්‍රාන්තයේ කුරෛෂ් නම් නගරයේ උපත ලැබුවේ ය. අධ්‍යාපනය සඳහා වියදම් කිරීමට අවශ්‍ය තරම් මුදල් එතුමාගේ පියාණන් විසින් ඉතිරි කර තිබුණි.

ප්‍රාථමික අධ්‍යාපනය නෛසාපුර්හි ලැබුවේ ය. හදීස් කලාවෙහි උසස් අධ්‍යාපනය ලැබීම උදෙසා විදේශ රටවල් කිහිපයක සංචාරය කළේ ය. මේ සංචාරවල තවත් අරමුණක් වූයේ හදීස් එක් රැස් කිරීම ය. ඉස්හාක් ඉබ්නු රාහවයිහි, අහ්මද් ඉබ්නු හන්බල් වැනි පඬිවරුන්ගෙන් හදීස් කලාව හැදෑරුවේ ය.

අති විශිෂ්ඨ වූ මතක ශක්තියක් එතුමාට තිබුණේ ය. ඒ ගැන සඳහන් කරන අබූ හුරෛරා නම් මහාචාර්යවරයා "ලොව විශිෂ්ටතම මතක ශක්තියක් සතු පුද්ගලයන් අතර ඉමාම් මුස්ලිම් ද එක් කෙනෙකි" යි පවසා ඇත. තමා එක්රැස් කළ හදීස් සියල්ල ම, කට පාඩම් කරමින් මතකයේ රඳවාගෙන ඔහු සිටියේ ය.

නෛසාපූර් සහ බග්ඩැඩ් නගරවල ඉගැන්වීමෙහි නිරත වූ ඉමාම් මුස්ලිම් තුමා වෙතින් දහස් ගණනින් සිසු පිරිස් අධ්‍යාපනය ලැබූහ. ඉමාම් තිර්මිදී, අබූ බක්ර් ඉබ්නු කුෂෛමා වැනි සිසුන් ද ඒ අතර වූහ.

ඉමාම් මුස්ලිම් තුමාට හදීස් කෙරෙහි තිබූ ලැදියාව හා උනන්දුව කොතරම් දැයි පහත සඳහන් සිද්ධියෙන් හොඳින් වටහා ගත හැකිය. වරක් නෛසාපුර්හි හදීස් සම්බන්ධයෙන් විද්වතුන් පිරිසක් සමඟ සාකච්ඡාවක යෙදී සිටියේ ය. ඒ අවස්ථාවේ එක් හදීසයක් පිළිබඳව ප්‍රශ්නයක් ඉමාම් වෙත එල්ලවූ විට එම හදීසය ඉමාම් තුමාට අමතක වී තිබුණි. ලක්ෂයකටත් වැඩි හදීස් එතුමාගේ මතකයේ රැඳී තිබුණ ද එතැන්හි නැගූ ප්‍රශ්නයට අදාළ හදීසය කොතරම් උත්සාහ කළ ද මතක් කිරීමට නොහැකි විය.

ඒ ගැන සිත් වේදනාවෙන් තම නිවසට ගොස් තමා සටහන්කර තිබූ පොත්වල එම හදීසය සොයන්නට පටන්ගත්තේ ය. දිගු වේලාවක් ගත වූ මේ ව්‍යායාමයේ දී එතුමා නිරත වී නොදැනුවත්ව රටඉඳි විශාල ප්‍රමාණයක් කෑමෙන් එය අගුණ වී රෝගාතුර විය. හදීසය අමතක වීමෙන් ඇතිවූ සිත් වේදනාවෙන් හා රෝගය උග්‍ර වීමෙන් ඉමාම් තුමා මෙලොවින් සමුගත්තේ ය. එතුමාගේ මෘත දේහය නෛසාපුර්හිදි භූමදානය කරන ලදි. අභාවය සිදු වූයේ හිජ්රි 261 දී එනම් ක්‍රිස්තු වර්ෂ 874 දී ය.

## සහිහ් මුස්ලිම්

ඉතිහාසය, කුර්ආනය යනා දී විවිධ විෂයයන් අළළා ග්‍රන්ථ 18 ක් ඉමාම් මුස්ලිම් තුමා විසින් රචනා කරන ලද නමුත් "සහිහ් මුස්ලිම්" නම් වූ හදීස් ග්‍රන්ථය නිසා මොහු ඉමහත් කීර්තියට පත්විය. ජීවිතයේ මුල් භාගය පුරා හදීස් එක් රැස් කිරීම වෙනුවෙන් වැය කළ එතුමා, ජීවිත කාලයේ අග භාගයේ දී ඒවා ග්‍රන්ථාරූඪ කිරීමෙහි නිරත විය. තමන් වෙත ලැබූ තුන් ලක්ෂයක් පමණ හදිස් සංඛ්‍යාවෙන් හදිස් හත් දහසක් තෝරා ගත්තේ ය. නොයෙකුත් කොන්දේසි හා නිර්ණායකයන් මත නැවතත් ඒවා පරීක්ෂණයට ලක් කරමින් අවසානයේ හදීස් 4000 ක් පමණක් තම ග්‍රන්ථයට ඇතුළත් කළේ ය. මෙලෙස සකස් කළ "සහීහ් මුස්ලිම්" ග්‍රන්ථය එවකට විසූ සුප්‍රසිද්ධ මුහද්දිසින් වරයෙකු වූ අබූසුර්ආ රලියල්ලාහු අන්හු තුමාට පිරිනැමුවේ ය. එතුමා විසින් නිවැරදි බව සනාථ කරමින් අනුමැතිය ලබා දීමෙන් පසුව ග්‍රන්ථය ප්‍රකාශයට පත් කළේ ය. ඉමාම් බුහාරි සහ ඉමාම් මුස්ලිම් දෙපළගේ ග්‍රන්ථවල එකිනෙකට සමාන වූ හදීස් බොහෝමයක් දක්නට ඇත. ඒවායේ භාවිතා වන වචන වලද, වාර්තාකරුවන්ගේ නම්වල ද වෙනසක් නොවීම වැදගත් ලක්ෂණයකි. හදිස්වල නිරවද්‍යතාවය මෙයින් පෙන්නුම් කෙරේ. මෙසේ ඉමාම් වරුන් දෙදෙනා විසින් ම එකම විදියට සටහන් කරනු ලබන හදිස්වලටයි "මුත්තෆකුන් අලෛහි" එනම් "දෙදෙනාම එකඟ වූ" යන විශේෂ නම භාවිතා කෙරෙනුයේ.

සහීහ් මුස්ලිම් නම් වූ මෙම වැදගත් ග්‍රන්ථයට විචාර ග්‍රන්ථ රාශියක් ලියවී ඇත. ඉමාම් නවවි රහ්මතුල්ලාහි අලෛහි විසින් රචනා කරන ලද ග්‍රන්ථය එයින් මුල් තැන ගනියි.

### ක්‍රියාකාරකම්

හදිස් ක්ෂේත්‍රයට ඉමාම් මුස්ලිම් රහ්මතුල්ලාහි අලෛහි තුමාගෙන් ඉටුවූ සේවය පිළිබඳ විග්‍රහ කර දක්වන්න.

## III ඉමාම් අබූ දාවූද් රහ්මතුල්ලාහි අලෛහි

"කුතුබුස් සිත්තා"නම් වූ හදිස් හයක නිර්මාතෘවරුන්ගෙන් අබූ දාවූද් සුලයිමාන් අෂ්අස් රහ්මතුල්ලාහි අලෛහි තුමා "සුනනු අබූ දාවූද් "ග්‍රන්ථයේ කර්තෘවරයා ය. හිජ්රි 202 වර්ෂයේ උපත ලැබූ ඉමාම් අබූ දාවූද් රහ්මතුල්ලාහි අලෛහි තුමන්ගේ උපන් ස්ථානය සිජිස්තාන් නගරයයි. මූලික අධ්‍යාපනය නයිසාපූර්හි ලැබූ එතුමා පසුව කුරාසන්, සිරියා සහ හිජාස් යන නගරවල දී තවදුරටත් අධ්‍යාපනය ලැබුවේ ය. ඉගෙනීම් කටයුතුවල යෙදෙන අතරතුරදී හදිස් රැස්කිරීමේ කාර්යයේ ද නිරත වී සිටියේ ය.

ඉමාම් අහ්මද්ඉබ්නු හන්බල්, සුලයිමාන් ඉබ්නු වහාබ් සහ අබුල් වලිද් නම් ප්‍රබල ආචාර්යවරුන් ගෙන් අධ්‍යාපනය ලැබීමේ භාග්‍යය මෙතුමාට ලැබිණි. යහපත් ගති ගුණවලින් සපිරි ඉමාම් අබූදවූද් තුමාට විශිෂ්ට වූ මතක ශක්තියක් ද තිබුණි. ලක්ෂ 05 කට වැඩි හදීස් සංඛ්‍යාවක් එක් රැස් කිරීමට සමත් විය.

ඉස්ලාමීය නීතිය මෙන්ම තෆ්සීර් කලාවේ ද ප්‍රවීණත්වයක් ලබාසිටි ඉමාම් තුමා බස්රා නගරයේ පදිංචි වී ඉගැන්වීමේ කාර්යයෙහි නිරත විය. එතුමාගේ ශිෂ්‍ය පිරිස් අතරින් එතුමාගේ පුතණුවන් වන අබු බකර් ඉබ්නුල් අහ්රාබි, ඉමාම් තිර්මිදි, ඉමාම් නසාඊ වැනි විශිෂ්ට පුද්ගලයෝ ද වූහ. බුහාරි ඉමාම් තුමා වැනි ම අම්හිරි අත්දැකීමකට ඉමාම් අබූ දවූද් තුමාටද මුහුණ පාන්නට සිදුවිය. මුවෆ්ෆක් නැමැති හමුදපති වරයෙක් ඉමාම් තුමාව බස්රා නගරය වෙත කැඳවා ඔහුගේ පුතුන්ට පුද්ගලිකව පන්ති පවත්වන ලෙස අණ කළේ ය. පුද්ගල අණවලට හිස නැමීමට සූදානම් නැති ඉමාම් තුමා එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට තරම් නිර්භීත කෙනෙකු විය. මෙතුමා හිජ්රි 275 වර්ෂයේදී වයස 73 දී බස්රා නගරයේ අභාවප්‍රාප්ත විය.

## සුනනු අබූ දවූද්

ග්‍රන්ථ රාශියක කර්තෘ වරයා වන අබූ දවූද් ඉමාම් තුමා මුස්ලිම් ලෝකයේ විශාල පැසසුමට ලක්වූයේ එතුමාගේ "සුනනු අබූ දවූද් " නම් වූ හදීස් ග්‍රන්ථය හේතු කොට ගෙන ය. පුරා අවුරුදු 20 ක උත්සාහයේ ප්‍රතිඵලයෙන් එක් රැස් කළ හදීස් 500,000 න් 4800 ක් පමණක් තෝරා ග්‍රන්ථය සකස් කළේ ය. "ෆික්හ් කලාව", නම් වූ ඉස්ලාමීය නීති සම්බන්ධයෙන් ද මනා දැනුමක් ලබා සිටීම හේතුවෙන් තම හදීස් ග්‍රන්ථයෙන් පරිච්ඡේද පෙළ ගැස්වීමේ දී නීති පිළිබඳ හදීස්වලට ගැලපෙන ආකාරයට සැකසුවේ ය. මේ නිසා ෆික්හ් ගැන සලකා බැලිමේ දී සිහාහුස් සිත්තා ග්‍රන්ථ පද්ධතිය තුළින් මුල් තැන හිමි වනුයේ සුනනු අබූ දවූද් ග්‍රන්ථයටයි යනු විද්වතුන් බොහෝ දෙනාගේ මතයයි.

මෙම ග්‍රන්ථය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එය ප්‍රසිද්ධියට පත් කිරීමට පෙර තම ගුරුතුමා වූ ඉමාම් අහමද් ඉබ්නු හන්බල් පඬිතුමා වෙත පිරිනමා අනුමැතිය ලබාගත්තේ ය. ඉබ්නු අල් අහ්රාබි මෙම හදීස් ග්‍රන්ථය සම්බන්ධයෙන් අදහස් දැක්වීමේ දී "කුර්ආනයත් සුනනු අබූ දවූද් ග්‍රන්ථයත් කෙනෙකු සතුව තිබේ නම් අනෙකුත් මූලාශ්‍රවලින් කරුණු සෙවීම අවශ්‍ය නොවන්නේ ය" යයි පවසා ඇත.

### ක්‍රියාකාරකම්

පාසලක මුස්ලිම් මජ්ලිස් රැස්වීම් වැඩ සටහනේ දී සිසුන් දෙදෙනෙකු විසින් රඟ දැක්වීම සඳහා සුනනු අබූ දවූද් ග්‍රන්ථය පිළිබඳ දෙබසක් රචනා කරන්න.

## IV ඉමාම් තිර්මිදි රහ්මතුල්ලාහි අලෛහි

අබූ ඊසා මුහම්මද් ඉබ්නු ඊසා අත්තිර්මිදි යනු මෙතුමාගේ සම්පූර්ණ නමයි. ඉරානයේ හි පිහිටි තිර්මිද් නගරයේ හිජ්රි වර්ෂ 209 දී උපත ලැබුවේය. කුරාසන් ප්‍රාන්තයේදී මූලික අධ්‍යාපනය සම්පූර්ණ කළේ ය.

ඉමාම් බුහාරි රහ්මතුල්ලාහි අලෛහි තුමන්ගේ විශිෂ්ටත්වය ගැනත්, එතුමාගේ උදාර සේවය ගැනත් දැනුවත් වී සිටි ඉමාම් තිර්මිදි රහ්මතුල්ලාහි අලෛහි තුමා ද එවැනි සේවයක් ඉටුකළ යුතුයයි අධිෂ්ඨාන කර ගත්තේ ය. ඒ අනුව ඉගෙනුම් කටයුතුවලින් පසුව විදෙස් රටවල්වල සංචාරයේ යෙදෙමින් හදීස් එක්රැස් කළේ ය. මේ නිමිත්තෙන් බස්රා, කූෆා, හිජාස් වැනි ප්‍රදේශවල වසර ගණනාවක් ගත කිරීමට සිදු විය.

ඉමාම් බුහාරි, ඉමාම් මුස්ලිම් වැනි ශ්‍රේෂ්ඨ ඉමාම්වරුන් ගෙන් වැඩිදුරටත් අධ්‍යාපනය ලැබුවේ ය. පසුව ඉගැන්වීමේ කටයුතුවල යෙදෙමින්, සිසුන් දහස් ගණනකට අධ්‍යාපනය ලබා දුන්නේ ය. මොවුන් අතරින් මුහම්මද් අහ්මද් ඉබ්නු මරූසි විශේෂයෙන් සඳහන් කළ යුතු කෙනෙකි.

වරක් ඉමාම් තිර්මිදි තුමා තම මක්කා ගමනේ දී තම ගුරුතුමන් බැහැ දැකීමට සිතාගෙන ඒ අවස්ථාවේ එතුමා වෙත ඉදිරිපත් කර, ඒවායේ නිවැරදිභාවය තහවුරු කර ගැනීම පිණිස හදීස් කිහිපයක් සටහන් කරගෙන සිටියේ ය. එහෙත් එසේ ගුරුතුමා හමුවූ අවස්ථාවේ අදාළ සටහන අස්ථානගත වීමෙන් එය සොයා ගත නොහැකි විය. එසේ වුව ද ඒ බව ගුරුතුමාට නොකියා, හිස් කඩදාසියක් අතැතිව අදාළ හදීස් කිහිපය කියවාගෙන ගියේය. හිස් කඩදසිය බව දුටු ගුරුතුමා කෝපයට පත් වූ බව පෙනීයාමෙන් තම තත්වය පැහැදිළි කර, හදීස් සියල්ල තමා කට පාඩම් කරගෙන සිටින බව පැවසුවේ ය. එය පරීක්ෂා කර තහවුරු කර ගත් ගුරුතුමා ඉමාම් තුමාගේ මතක ශක්තිය ගැන පුදුමයට පත්වූයේ ය.

### ජාමිඋත් තිර්මිදි

සුප්‍රසිද්ධ හදීස් ග්‍රන්ථ හයකින් එකක් වන මෙම ග්‍රන්ථය ඉමාම් තිර්මිදි රහ්මතුල්ලාහි අලෛහි විසින් රචනා කරන ලද ග්‍රන්ථ කිහිපයකින් ප්‍රධාන එකක් යයි සැලකේ. එතුමා එක්රැස් කළ ලක්ෂයකටත් වැඩි හදීස් එකතුවෙන් 4800 ක් පමණක් තෝරාගෙන තම ග්‍රන්ථයට ඇතුළත් කළේ ය.

සෙසු හදීස් ග්‍රන්ථවලට බොහෝ සෙයින් සමාන වුව ද, විශේෂ වූ ලක්‍ෂණ කිහිපයක් ද මෙම ග්‍රන්ථයේ දැකිය හැකි ය. එකම වර්ගයේ හදීස් නැවත නැවතත් මෙහි සටහන් නොවීම විශේෂ ලක්‍ෂණයකි. "ෆකීහ් " නමැති නීති සම්පාදකවරුන්ට එක් එක් නීති බැගින් පෙන්වා ඒවායේ සම්පාදනයට සාධක වූ කරුණු මෙහි ඇතුළත් කර ඇත. තව ද හදීස්වල විස්තර විචාර සමග හදීස්වල වාර්තාකරුවන් පිළිබඳ විග්‍රහ කිරීම ද මෙම ග්‍රන්ථයෙහි දක්නට ඇත.

සැම හදීසයක ම අවසානයේ ඒ හදීසය සම්බන්ධයෙන් එක් එක් මද්හබ්වල පවතින්නාවූ යම් යම් වෙනස්කම් ගැන ද සටහන් කර තිබීම වැදගත් අංගයකි.

විෂය කරුණු අනුව දීර්ඝ පරිච්ඡේද මෙන්ම කෙටියෙන් ලියවුණු සමහර පරිච්ඡේද ද ඇතුළත් ය. ග්‍රන්ථයේ නම එක් ස්ථානයක "ජාමිඋ" ලෙසත් වෙනත් ස්ථානයක "සහීහ් " ලෙසත් සටහන් වේ. තම හදීස් 4800 ග්‍රන්ථාරූඪ කිරීම සම් පූර්ණ කිරීමෙන් පසුව, හිජාස්, කුරාසාන් වැනි ප්‍රාන්තවල උගත් ආචාර්ය වරුන් වෙත ග්‍රන්ථය යවා ඒ උදවියගේ එකඟත්වය ලැබීමෙන් පසුවයි, ග්‍රන්ථය ප්‍රකාශයට පත් කළේ.

මෙම ග්‍රන්ථයේ විශේෂත්වය ගැන එහි කර්තෘවරයා වන ඉමාම් තුමා පවසන්නේ මෙසේය.

"යම් කෙනෙකුගේ නිවසෙහි ජාමිඋ ග්‍රන්ථයක් තිබේ නම් එය නබි කෙනෙකු එම නිවසේ වාසය කරමින් දේශනා කරන්නාක් මෙන් ය"

**ක්‍රියාකාරකම්**

1. හදීස් ක්ෂේත්‍රයට ඉමාම් තිර්මිදි තුමන් විසින් ඉටු කරන ලද සේවය විස්තර කරන්න.
2. ජාමිඋත් තිර්මිදි ග්‍රන්ථයේ දක්නට තිබෙන්නාවූ විශේෂ ලක්ෂණ විග්‍රහ කරන්න.

## V ඉමාම් නසාඊ රහ්මතුල්ලාහ් අලෛහි

අබූ අබ්දුර් රහ්මාන් අහ්මද් ඉබ්නු සුඅයිබ් අන් නසාඊ යනු මෙතුමාගේ සම්පූර්ණ නමයි. හිජ්රි වර්ෂ 215 දී කුරාසාන් ප්‍රාන්තයේ නසාහ් නගරයෙහි උපත ලැබුවේය. එතුමා මූලික අධ්‍යාපනය ඉමාම් කුතෛබා ඉබ්නු සාද් නම් ආචාර්ය තුමාගෙන් ලබා ගත්තේ ය. පසුව හදීස් ක්ෂේත්‍රයෙහි ප්‍රවීණයකු වීමේ අරමුණින් සෙසු හදීස් වියතුන් මෙන් මෙතුමා ද ඉරානය, ඉරාකය, සිරියාව, ඊජිප්තුව, හිජාසය ආදි රටවල චාරිකාවේ යෙදුණේ ය.

එසේ චාරිකාවේ යෙදුන වකවානුවේ ඉස්හාක් ඉබ්නු රාහවයිහි, ඉමාම් අබූ දවූද්, ඊසා ඉබ්නු නස්ර් වැනි ප්‍රවීණ ආචාර්යවරුන්ගෙන් වැඩි දුරටත් අධ්‍යාපනය ලබමින්, තම දැනුම පුළුල් කර ගත්තේ ය. තමාගේ හදීස් ග්‍රන්ථය රචනා කරමින් සිටි එම කාලයේ සිසුන් වෙනුවෙන් පංති පැවැත්වීමෙහි ද නිරත විය. එතුමා තම අන්තිම කාලයේ ඊජිප්තුවේ ඉගැන්වීමේ කටයුතුවල යෙදුණේ ය. ඉමාම් තුමාගේ ශිෂ්‍යයන් අතරින් හදීස් වියතුන් වන තබරානි, තහාවි වැනි අය ද වූහ.

"හදීස්", "ෆික්හ්" යන ක්ෂෙත්‍ර දෙකෙන් ම මනා ප්‍රවීණත්වයක් අත් කරගෙන සිටි නසාඊ ඉමාම් තුමන්ගේ මතක ශක්තිය කාගෙත් පැසසුමට ලක් විය. ඉමාම් මුස්ලිම් තුමාටත් වඩා අධික හදීස් සංඛ්‍යාවක් මෙතුමා තම මතකයෙහි රඳවාගෙන සිටියේ ය.

නොයෙක් රටවල සංචාරය කරමින් ලබා ගත්තාවූ දැනුම, අනුන්ට බෙද දීම සඳහා ඉමාම් නසාඊ තුමා තෝරා ගත් රට ඊජිප්තුවයි. නමුත් වරක් සිරියාවේ ඩමස්කස් නගරයට ගිය අවස්ථාවක දී එහි දුටු තත්ත්වයක් නිසා එම නගරයේ ලැගුම් ගන්න තීරණය කළේ ය. ඩමස්කස් නගර වැසියෝ හතරවන කලීෆා අලි රලියල්ලාහු අන්හු තුමා පිළිබඳ වැරදි අදහස් දරන බව පෙනී යාමෙන්, නසාඊ ඉමාම් තුමා දැඩි කනස්සල්ලට පත්වූයේ ය. එම නිසා එම වැරදි මත දුරු කරලීම සඳහා පොතක් රචනා කිරීමෙහි නිරත විය. මෙයින් කෝපයට පත් නගරවාසීහු ඉමාම් තුමාට පහර දෙන්නට වූහ. මේ පහරදීම් වලින් රෝගාතුර වී එම නගරයෙන් පිටත් වී මක්කා නගරය බලා යමින් සිටියදී පලස්තීනයෙහි රම්සා නගරයේ හිජ්රි 303 දී අභාවප්‍රාප්ත වූහ. එහෙත් ඉමාම් තුමා මක්කාවට පැමිණීමෙන් පසුව මරණය සිදු වූ බවටත්, මක්කාවේ ඉමාම් තුමන්ගේ දේහය භූමිදනය කරනු ලැබූ බවටත් සමහර ලේඛකයෝ අදහස් දක්වති.

නසාඊ ඉමාම් තුමාණන්ගේ "සුනනුන් නසාඊ " නමැති හදිස් ග්‍රන්ථය කුතුබුස් ඨස් සිත්තා නම් හදීස් ග්‍රන්ථයන් හි පස්වන ස්ථානයෙහිලා සලකනු ලැබේ.

### සුනනුන් නසාඊ

ඉමාම් නසාඊ රහ්මතුල්ලාහ් අලෛහි තුමාණෝ රටවල් ගණනාවකින් සොයා එක්රැස් කර ගත්තා වූ පන් ලක්ෂයකටත් අධික හදීස්වලින් තෝරා ගත් හදීස් පමණක් ග්‍රන්ථාරූඪ කරමින් "සුනනුන් නසාඊ" යන නමින් හදීස් ග්‍රන්ථය ප්‍රකාශයට පත් කළේ ය.

තෝරා ගත් එම හදීස්වල භාවිත කළ සෑම වචනයක් ම නියම වචන දැයි තහවුරු කර ගැනීමෙන් අනතුරුව  පමණක් මිස, කිසිම හදීසයක් ලේඛන ගත නොකිරීමට ඉමාම් තුමා වගබලා ගත්තේ ය. මුලදී මෙතුමා "සුනනුත් තබර් අන්නසාර් " යන නමින් හදීස් ග්‍රන්ථයක් සකස් කළ බව ආරංචි වීමෙන්  මුස්ලිම් රජතුමෙක් එම ග්‍රන්ථය පිළිබඳව කරුණු විමසීය. තම ග්‍රන්ථයේ "සහීහ් හසන්" යනාදී වශයෙන් විවිධ වර්ගවල හදීස් ඇතුළත් කර තිබෙන බව ඉමාම් තුමා පෙන්වා දුන්නේ ය. එවිට රජ්ජුරුවෝ සහීහ් වර්ගයේ හදීස්වලින් පමණක්  සමන්විත ග්‍රන්ථයක් සකස් කරන්නැයි ඉල්ලා සිටියහ. රජ්ජුරුවන්ගේ එම ඉල්ලීම අනුව "සුනනුන් නසාර්" ග්‍රන්ථය ඉමාම් තුමන් විසින් සකස් කරන ලදී. මේ හේතුව නිසා මෙම ග්‍රන්ථය "අල්මුජ්තනා"(තෙලා ගන්නා ලද ) සහ " අල් මුජ්තබා"(තෝරා ගන්නා ලද) යන විශේෂ නම්වලින් ද හඳුන්වනු ලබයි.

මෙම ග්‍රන්ථය කොටස් 50 කින් සමන්විතය. "සෙයියිද් ජලාලුද්දීන්" නැමති මහාචාර්යවරයා මෙම ග්‍රන්ථය ගැන "සෑම හදීසයක් ම අවශ්‍ය සාධකයන් සහිතව සටහන් කර දැක්වීමෙහි, මීට සමාන කළ හැකි වෙනත් ග්‍රන්ථයක් නොමැත" යනුවෙන් පවසා ඇත.

### ක්‍රියාකාරකම්

1. ඉමාම් නසාර් තුමන් උපත ලැබුවේ හිජ්රි වර්ෂ කීයේ දී ද?
2. "හදීස් ක්ෂෙත්‍රයට ඉමාම් නසාර් තුමන් ඉටු කළ සේවය" යන මැයෙන් රචනාවක් ලියන්න.

## VI ඉමාම් ඉබ්නු මාජාහ් රහ්මතුල්ලාහි අලෛහි

ඉරාන දේශයේ තස්වින් නම් ගම්මානයේ හිජ්රි 209 වර්ෂයේ උපත ලැබූ මෙතුමා "සිහාහුස් සිත්තා"නම් හදීස් ග්‍රන්ථ හයෙන් එකක් වන "සුනනු ඉබ්නු මාජා" ග්‍රන්ථයේ නිර්මාණකරුය. එතුමාගේ සැබෑ නම අබූ අබ්දුල්ලාහ් මුහම්මද් ඉබ්නු යසීද් අල් තස්වීනි යන්නයි. "මාජාහ්" යනු එතුමාගේ පියාණන්ට භාවිත වූ අනෙකුත් නමක් බවටත් මවගේ නම බවටත් අදහස් දෙකක් ඇත. හදීස් එක්රැස් කිරීමේ කර්තව්‍යය උච්ච අවස්ථාවක පැවති යුගයක ජීවත් වූ ඉමාම් තුමාට ද එම ක්ෂෙත්‍රයෙහි ප්‍රවීණයෙකු වීමේ අභිලාෂය ඇති විය.

ඒ අනුව සිය රටේ දී අධ්‍යාපනය ලැබීමෙන් පසු කුරාසානය, ඉරාකය, හීජාස්, සිරියාව, ඊජිප්තුව, බස්රා, කුබා සහ වාලිද් යනාදි ප්‍රදේශවල සංචාරය කරමින් එහි විසූ පඬිවරුන් හමු වී එතුමන්ලාගෙන් හදීස් කලාව හා අනෙකුත් කලාවන් පිළිබඳ අධ්‍යාපනය ලැබුවේ ය. ඒ අතරතුරදී තමන්ට ලැබෙන හදීස් එක්රැස් කිරීමෙහි ද නිරත වුවේ ය. අබූ බකර් ඉබ්නු අබූ ශයිබා සහ ඉබ්‍රාහිම් ඉබ්නු මුන්දිර් යන දෙදෙනා ඉබ්නු මාජාහ් තුමාට හදීස් කලාව ඉගැන්වූ ආචාර්යවරුන් අතර විශේෂයෙන් සඳහන් කළ යුත්තෝ වෙති.

"සුනනු ඉබ්නු මාජාහ්" හදීස් ග්‍රන්ථයට අමතරව ඉතිහාස පොතක් සමඟ අල් කුර්ආන් විවරණ ග්‍රන්ථයක් ද ඉමාම් තුමා විසින් රචනා කර තිබේ. හිජ්රි වර්ෂ 273 දී මෙතුමා අභාවප්‍රාප්ත වුයේ ය.

## සුනනු ඉබ්නු මාජාහ්

"සිහාහුස් සිත්තා" ග්‍රන්ථ අතරින් හය වන ස්ථානය හිමි වනුයේ සුනනු ඉබ්නු මාජාහ් ග්‍රන්ථයටයි. ඉමාම් ඉබ්නු මාජාහ් රහ්මතුල්ලාහ් තමන්ට සොයා ගත හැකි වු හදීස් 40,000 න් හදීස් 4000 ක් තෝරා ගෙන ඒවා ග්‍රන්ථාරූඪ කළේ ය. ග්‍රන්ථයේ කොටස් 35 කුත් පාඩම් 1500 කුත් ඇත. එහෙත් ඉමාම් තුමා තම ගුරුතුමා වු අබු බකර් ඉබ්නු අබු ෂෛබා නැමති ආචාර්යවරයෙකු අනුගමනය කරමින් මෙම ග්‍රන්ථය සකස් කළේ ය.

මෙතෙක් අපි හදීස් කලාව වෙනුවෙන් ජීවිතය කැප කළ මුහද්දිසින් (හදීස් වියතුන්) වරුන් පිළිබඳ ඉතිහාසය හා අදළ ඉමාම්වරුන්ගේ සේවාවන් දෙස අවධානය යොමු කළෙමු. එසේ යොමු කිරීමෙන් එම විද්වතුන් ඉස්ලාම් ආගම වෙනුවෙන් ඉටු කළ වටිනා සේවය කෙතරම් දැයි වටහා ගත්තෙමු. එපමණක් නොව නබි තුමාණන්ගේ ජීවිතය පිළිබඳ විස්තර සියල්ල මුළුමනින් ම මිනිස් සමාජයට ලබා දීමේ අධිෂ්ඨානය ඇතුව හා ඒ වෙනුවෙන් ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකොට තම ජීවිතයම ඒ සඳහා කැප කරමින් මහඟු සේවයක් ඉටු කළ බව අපට හොඳින් පෙනී යයි. ලෝක අවසානය දක්වා මිනිසාට අවශ්‍ය මග පෙන්වීම් ඉහත කී හදීස් ග්‍රන්ථවලින් ලැබෙනු ඇතැයි විශ්වාස කරමින් මෙම ශ්‍රේෂ්ඨ පුද්ගලයින්ගේ සේවය අල්ලාහුතආලා විසින් පිළිගනිත්වා! යයි ප්‍රාර්ථනා කරමු.

**ක්‍රියාකාරකම්:**

- හදීස් ක්ෂේත්‍රයෙහි ඉමාම් ඉබ්නු මාජාහ් තුමාණන්ගේ සේවය ගැන රචනයක් ලියන්න.

## 6.2 ෆික්හ් කලාව හා නීති විශාරදයෝ

1. "ෆික්හ්" යනු අවබෝධය නොහොත් දැනුම වේ.
2. මිනිසුන්ගේ පෞද්ගලිකවූත්, සාමූහිකවූත් ජීවිතයට අදාළ සෑම කරුණක්ම ෆික්හ් යන්නෙහි අන්තර්ගතය.
3. ෆික්හ් කලාවෙහි නිරත වූවන් ඉමහත් වෑයමක් දරා ඇත.
4. 'ඉජ්තිහාද්' ගවේශණයෙහි නිරත වූ ගරු ඉමාම්වරු සිව්දෙනා පිළිබඳවත් එතුමන්ගේ ජීවිත කතාවන් ගැනත් විස්තර කරයි.
5. ඉමාම්වරුන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ හඳුනා ගනියි.

අරාබි භාෂාවේ "ෆික්හ්" යන වචනයේ තේරුම අවබෝධය හා දැනුම යන්නයි. ඉස්ලාමීය නීති "ඉල්මුල් ෆික්හ් " යන නමින් හැඳින්වේ. "මිනිස් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඉස්ලාමීය මූලාශ්‍රවලින් ලබාගත් ආගමික කටයුතු පිළිබඳ නීති " යනුවෙන් වූ නිර්වචනයක් ඉස්ලාමීය ෂරීඅත් ක්ෂේත්‍රයේ භාවිතා කරනු ලැබේ. මිනිස් ක්‍රියාකාරකම් යන්නෙන් මිනිසුන්ගේ පෞද්ගලික හා සාමූහික ජීවිතය අදහස් කෙරේ.

ඉස්ලාමයේ ආරම්භයත් සමගම ඉස්ලාමීය නීති කලාව ද ආරම්භ විය. එහෙත් මුහම්මද් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ජීවතුන් අතර සිටිනතාක් කල් නීති එක්රැස් කර සහාබාවරුන්ගේ කාලයෙහි ග්‍රන්ථාරූඪ කිරීමේ කටයුතු සිදු වූයේ නැත. නීති විශාරදයෙකු ලෙස නබි තුමා ඔවුන් අතර ජීවත් වූ නිසා එවැනි අවශ්‍යතාවයක් එවිට පැන නැගුනේ නැත. "ඉල්මුල් ෆික්හ්" නම් නීති කලාව වෙනම කලා ක්ෂෙත්‍රයක් ලෙස වර්ධනය වීම හා නීති ග්‍රන්ථාරූඪ කිරීම ආරම්භ වූයේ හිජ්රි දෙවන ශත වර්ෂයේ දීය.

හිජ්රි පළමුවන ශත වර්ෂයේ අවසානය දක්වා වූ කාලය තුළ දී මුස්ලිම් ජනතාවගේ පුද්ගලික හා සාමූහික ගැටළු සියල්ලට ම පහසුවෙන් විසඳුම් සොයා ගත හැකි විය. ඊට හේතු වූයේ එවකට සිටි කලීෆාවරුන් මෙන් ම විනිසුරුවන් ද ඉස්ලාමීය නීති පිළිබඳ මනා දැනුමකින් පසුවීම ය. නමුත් හිජ්රි දෙවන ශත වර්ෂයේ දී, එනම් උමයියාවරුන් ගේ පාලන කාලයේ අවසාන කොටසේ දී, බාහිර සංස්කෘතික බලපෑම් මුස්ලිම් ජන සමාජය තුළට පිවිසෙන්නට පටන් ගත්තේ ය. තව ද අන්‍ය ආගමික චින්තනවල එතෙක් ජීවත් වූ අය අලුතෙන් ඉස්ලාම් ආගම වැළඳ ගත්හ. මෙවැනි හේතූන් නිසා කලින් නොවූ විරූ ආකාරයේ විවිධ වූ ගැටළු හා ප්‍රශ්න අලුතෙන් පැන නැගුණි. මින් ඇතැම් ප්‍රශ්නවලට කුර්ආනයෙන් හෝ හදීස්වලින් සෘජුව හා පහසුවෙන් සොයා ගත හැකි විසඳුම් නොවීය. එවිට කුර්ආන්, සුන්නා සමග සහාබාවරුන්ගේ ආදර්ශයන් ද පදනම් කරගෙන ඉතා ගැඹුරට ඒවා අධ්‍යයනය කරමින් "ඉජ්තිහාද්" නම් ක්‍රමයෙන් එම ප්‍රශ්න වලට විසඳුම් සෙවීමට උගත් ඉමාම්වරු ඉදිරිපත් වූහ. "මුජ්තහිද්වරුන්" යයි ඔවුහු හඳුන්වති.

කලින් නොතිබූ ආකාරයේ අලුතින් ඇති වූ ප්‍රශ්නවලට විසඳුම් සෙවීමේදී පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කළහ :

1. අල් ඉජ්තිහාද් ගවේෂණයෙන් ලබා ගැනීම.
2. අල් ඉස්තින්බාත් සූල මූල පරීක්ෂා කරමින් නීති සොයා ගැනීම.
3. අල් තෆ්රීඋ උප ශීර්ෂ සම්පාදනය කිරිම.
4. අල් කියාස් අනුමාන කිරීම.

'කුර්ආනය රැකගැනීම සඳහා එය ලියා තැබිය යුතුයි' යන අදහස උමර් ඉබ්නු කත්තාබ් රලියල්ලාහු අන්හු තුමාට ඇති විය. එසේ ම හදීස් සියල්ල ග්‍රන්ථාරූඪ කිරීමේ අවශ්‍යතාවය කලීෆා උමර් ඉබ්නු අබ්දුල් අසීස් රලියල්ලාහු අන්හු තුමාට වැටහුනේ ය. එහෙත් 'ඉස්ලාමීය නීතිය ලේඛන ගත කිරීම මගින් එය රැක ගත යුතු ය.' යන හැඟීම කලීෆාවරුන් කිසි කෙනෙකුට ඇති වූයේ නැත. එම නිසා "ඉජ්තිහාද්" මගින් කුර්ආන් සහ සුන්නාවලින් නීතියට අදාළ කොටස් වෙන්කර ගනිමින් නීති ග්‍රන්ථ සකස් කිරීමේ කාර්යභාරය "මුජ්තහිද් " නම් ඉමාම්වරුන්ගේ වගකීමක් විය. නීති පිළිබඳ විද්වතුන් වූ මුජ්තහිද්වරු එම කර්තව්‍යය මුල දී පුද්ගලිකව ද පසුව සාමූහිකව ද මනා ලෙස ඉටු කළහ.

'කුර්ආනය' සහ "සුන්නා" යන මූලාශ්‍ර දෙක ඉස්ලාමීය නීතියේ උල්පත' යයි සලකනු ලැබුව ද, එම ක්ෂේත්‍රයේ වර්ධනයට ඉජ්තිහාද් නම් අධ්‍යයනය විශාල වශයෙන් ඉවහල් විය. මුල දී ඉජ්තිහාද් ආරම්භ වූයේ ප්‍රධාන මූලාශ්‍ර දෙකෙහි ආධාරයෙන් ය. පසුව ඉජ්මාඋ, කියාස් යන උප මූලාශ්‍ර දෙකේ දායකත්වය ද එයට ලැබුණි. ඉජ්මාඋ මඟින් ලබා ගත්තා වූ නීති, සාමූහිකවද කියාස් ක්‍රමයට ලබාගත්තා වූ විසඳුම් වෙන් වශයෙන් ද එළි දක්වන ලදී. එහෙත් ඒවා නිශ්චිත වශයෙන් නීති ග්‍රන්ථයක් හැටියට එළි දැක්වූයේ නැත. ලොව විවිධ ප්‍රදේශ වල විසූ විද්වතුන් විසින් තම තමන්ට ලැබුණු සාධක අනුව නිගමන වලට පැමිණීම හේතුවෙන් එකම ප්‍රශ්නයට විවිධ වූ විසඳුම් හා තීරණ ලබා දෙන ලදී. සංකීර්ණ වූ සමහර නඩු විමසීම්වල දී විනිසුරුවන් විසින් එකම වරදට විවිධ ආකාරයේ දඬුවම් දෙන ලදී. එවකට කුර්ආනය ග්‍රන්ථාරූඪ කර තිබුන නමුත්, හදීස් ඒ ආකාරයෙන් ග්‍රන්ථාරූඪව නොතිබීම මේ අවුල් සහගත තත්වයට ප්‍රධාන වශයෙන් හේතු විය.

එපමණක් නොව "මුජ්තහිද්" නම් නීති විද්වතුන්ට එකම ප්‍රශ්නයට කිහිප වතාවක් පිළිතුරු දීමට සිදු විය. මේ තත්වය වළක්වාලීම සඳහා මුජ්තහිද්වරු තමන් ලබා දුන් තීන්දු හා විසඳුම් ඇතුළත් පොත් ප්‍රකාශයට පත් කළහ. එසේ ම පන්ති පවත්වමින් නීති කලාව සිසුන්ට උගන්වන්නට ද වූහ. මේවායේ ප්‍රතිඵලයක් වශයෙන් මූලාශ්‍රවලින් නීතිය වෙන්කරවා ගැනීමේ දැනුම වර්ධනය විය.

අපගේ ගෞරවයට පාත්‍ර වූ සහාබාවරුන් අතරින් "ඉජ්තිහාද්" නැමති අධ්‍යයනයෙහි නිරත වූවන් හැටියට පහත සඳහන් හතර දෙනාගේ නම් සඳහන් කළ හැකි ය. ඃ

1. **උමර් ඉබ්නු කත්තාබ් රලියල්ලාහු අන්හු**
2. **හස්රත් අලි රලියල්ලාහු අන්හු**
3. **අබ්දුල්ලා ඉබ්නු අබ්බාස් රලියල්ලාහු අන්හු**
4. **අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් රලියල්ලාහු අන්හු**

මේ හතර දෙනාගෙන් හස්රත් අලි සහ අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් රලියල්ලාහු අන්හුමා යන දෙදෙනා ම වැඩි වශයෙන් කූෆා නගරයේ වාසය කළ නිසා කූෆා නගරවාසීහු මේ දෙදෙනාගෙන් නීති උපදෙස් හා නඩු තීන්දු ලබා ගෙන ඒවා ක්‍රියාත්මක කළහ. මේ අතර, හස්රත් අබ්දුල්ලාහ් ඉබ්නු අබ්බාස් රලියල්ලාහු අන්හු තුමාගෙන් නීති උපදෙස් ලබා ගෙන මක්කා සහ මදීනා නගර දෙක ඉස්ලාමීය නීති පිළිබඳ ප්‍රසිද්ධියක් දැරූ ප්‍රදේශ දෙකක් විය. ඉස්ලාමීය නීති පිළිබඳ වංශ කතාවේ වැදගත් තැනක් හස්රත් අලි රලියල්ලාහු අන්හු තුමාට හිමි වේ. එම ක්ෂේත්‍රයට එතුමා ලබා දුන් දායකත්වය, එයට ශක්තිමත් අඩි තාලමක් වශයෙන් මෙන් ම නොමැකෙන සටහන් තැබීමක් වශයෙන් ද සඳහන් කළ හැකි ය.

ළමා වියේ සිට ම නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් සමඟ ඉතාමත් සමීපව ආශ්‍රය කළ කෙනෙකු වශයෙන් හස්රත් අලි රලියල්ලාහු අන්හු තුමා, වැඩි හදීස් සංඛ්‍යාවක් වාර්තා කළ කෙනෙකු විය. මේ ගැන වරක් එතුමාගෙන් විමසන ලද අවස්ථාවක දී, "නබි තුමාගෙන් මා කුමක් සම්බන්ධයෙන් විමසුවත් ඒ ගැන පැහැදිලි විස්තරයක් ලබා දෙයි" යනුවෙන් පැවසුවේ ය. උසස් ඝනයේ බුද්ධිමතෙකු වූ මෙතුමා නීති උපදෙස් ලබා දීමෙහි දක්ෂ කෙනෙකු පමණක්නොව සහාබාවරුන් අතර අවිවාදයෙන් පිළිගත් මාර්ගෝපදේශකයෙක් ද වූයේ ය.

කලීෆා උමර් රලියල්ලාහු අන්හු තුමා, වරක් අලි රලියල්ලාහු අන්හු තුමා ගැන අදහස් දැක්වීමේ දී "සංකීර්ණ වූ ගැටලු සහගත තත්වයක් අපට ඇති වී, එවිට අලි ද අප අතර නැති අවස්ථාවක් උදාවීමෙන් අල්ලාහ් අප ආරක්ෂා කරත්වා!" යයි පැවසුවේය.

නීති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මදීනා සහ කූෆා යන නගරවලට හිමි වූයේ විශේෂ වූ ස්ථානයකි. මෙම නගරවල විසූ මුජ්තහිද්වරු, නීති පිළිබඳ අධ්‍යයනයෙහි විශේෂ ප්‍රයත්න වල නිරත වූහ. හිජ්රි පළමුවන ශත වර්ෂය අවසානයේ ජීවත් වූ ඉමාම් අබූ හනීෆා රහ්මතුල්ලාහි අලෛහි සහ ඉමාම් මාලික් රහ්මතුල්ලාහි අලෛහි යන දෙදෙනා මෙම ක්ෂේත්‍රයේ කීර්තියට පත් විශාරදයෝ වූහ.

මුහද්දිසීන් නම් හදීස් වියතුන්ගේ සභාවක් මගින් හදීස් කලාව සමග ෆික්හ් කලාව ද එක්වර සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළ ඉමාම් මාලික් තුමා ආරම්භ කළේ ය. ඉබ්‍රහිම් අන්නහර්, අව්සාර් සව්රී වැනි නීතිවේදීන් නීති සම්පාදනවල යෙදී සිටිය ද, ඒවා ග්‍රන්ථාරූඪ නොවූ නිසා මෙන් ම, එම සංකල්පයන් ඉදිරියට ගෙන යාම සඳහා සිසු පරපුරක් නොසිටි නිසා ද ඒවා භාවිතයෙන් ඈත් වී ගියේ ය.

එහෙත්, ඉන් පසුව නීති ක්ෂේත්‍රයට පිවිසි ඉමාම් අබූ හනීෆා, ඉමාම් ෂාෆිර් ඉමාම් මාලික් සහ ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් යන ප්‍රබල ඉමාම්වරුන් විසින් සම්පාදනය කරන ලද නීති, මහජනයා අතර ප්‍රසිද්ධියට පත්විණ. අදත් භාවිතයේ ඇති. "මද්හබ්" යන නමින් දැනට පිළිපදිනු ලබන්නේ මෙම නීති මාලාවන් ය. එම නිසා මුජ්තහිද්වරුන් වන මේ ඉමාම්වරුන් ජීවත් වූ කාලවකවානුව, ඉස්ලාමීය නීති කලාව නම් වූ විශේෂ කලා ක්ෂේත්‍රයක් බිහිවූ යුගයක් හැටියට සලකනු ලැබේ.

ඉහත නම් සඳහන් ඉමාම්වරුන්ට පසුව ද, මුජ්තහිද්වරුන් බිහි වී, ෂරීඅත් නීති කලාව තව දුරටත් දියුණු කළහ. මුස්ලිම් ලෝකයේ අදත් පිළිගනු ලබන "මුජ්තහිද් මුත්ලක් " යනුවෙන් හඳුන්වනු ලබන නීති වියතුන් වන, ඉමාම්වරුන් හතර දෙනා පිළිබඳ වැඩි විස්තර කෙරෙහි මීළඟට අවධානය යොමු කරමු.

**ක්‍රියාකාරකම් :**

1. 'ෆික්හ්' කලාවේ මූලාරම්භය ගැන කෙටි විස්තරයක් ලියන්න.
2. 'ඉජ්තිහාද්' අධ්‍යයනයෙහි නිරත වූ සුප්‍රසිද්ධ නීති වියතුන් හතර දෙනා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

## I ඉමාම් අබූ හනීෆා රහ්මතුල්ලාහි අලෛහි තුමාගේ සේවාවන්

සුන්නත් වල් ජමාඅත් පාර්ශවයේ මුස්ලිම් ජනතාව විසින් පිළිගෙන අද දක්වා අනුගමනය කරනු ලබන මද්හබ් හතරෙන් පළමුවෙන් බිහිවූයේ ඉමාම් අබූ හනීෆා රහ්මතුල්ලාහි අලෛහි තුමාගේ හනෆි මද්හබ් ය. හිජ්රි වර්ෂ 80 දී කූෆා නගරයේ උපන් මෙතුමාගේ පියාගේ නම සාබිත් යයි සඳහන් වේ. පසු කාලයේ අබූ හනීෆා යන නමින් හඳුන්වනු ලැබූ නමුත් ඉමාම් තුමාගේ සැබෑ නම නුඃමාන් ය. ශ්‍රේෂ්ඨ නායකයා යන අර්ථයෙන් 'ඉමාමුල් අඃලම්' යන විශේෂ නමකින් ද එතුමා හඳුන්වනු ලැබුවේ ය.

කුඩා කල පටන් ම බුද්ධියෙන් හා අනෙකුත් දක්ෂතාවයන් හි ඉහළ කෙනෙකු වුවත් පියා නැතිවීම හේතුවෙන්, පවුලේ ආදයම උදෙසා වෙළෙඳමේ නිරතවීමට ඉමාම් තුමාට සිදු විය. එසේ නමුත් විද්වතුන්ගේ පෙළඹවීමෙන් අරාබි භාෂාව, දේශපාලනය, ඉතිහාසය, කුර්ආන්, හදීස්, ෆික්හ් නම් නීති කලාව සහ දර්ශනවේදය ආදී ක්ෂේත්‍රවල ඉගෙනීමේ යෙදුනේ ය. හජ් වන්දනාව සඳහා මක්කාවට ගොස් එහි දී අතාහ් ඉබ්නු අබීරබාහ් රලියල්ලාහු අන්හු, ඉබ්නු දීනාර් රලියල්ලාහු අන්හු නමැති ප්‍රබල විද්වතුන්ගෙන් හදීස් කලාව පිළිබඳ වැඩිදුර අධ්‍යාපනය ලැබුවේ ය.

හම්මාද් රලියල්ලාහු අන්හු නම් උස්තාද් වරයෙකුගේ අභාවයෙන් පසු එතුමා විසින් එතෙක් පවත්වාගෙන ගිය නීති, පාසලේ ඉගැන්වීම් කටයුතු භාරව සිටි ඉමාම් අබූ හනීෆා යටතට පත් විය. කලීෆා වරයාගේ උපදෙස් මත කූෆා නගරයේ එවකට පිහිටා තිබූ නීති කලා පීඨයේ උපදේශක ධූරයට ද පත් විය. මේ වනවිට "ඉජ්තිහාද්" කලාවෙහි ප්‍රවීණයෙකු හා අවංක වෙළෙඳ ව්‍යාපාරිකයෙකු ද වූ ඉමාම්තුමා, අල්ලාහ්ගේ නාමයෙන් ඉස්ලාමීය නීතිය පිළිබඳ පැහැදිලි අවබෝධය හා මනා නිපුණතාවය මුස්ලිම් සමාජයට ලබා දීම අරමුණු කර ගත්තේ ය. ඒ සඳහා එවකට විසූ ප්‍රබල විද්වතුන් හතලිස් දෙනෙකු සමඟ එකතු වී සමස්ත ෆික්හ් නීති ක්‍රමයම අධ්‍යයනය කළේය. අබූ යූසුෆ් සහ මුහම්මද් ඉබ්නු හසන් යන දෙදෙනා ද මෙම ක්‍රියාවලියේදී අබූ හනීෆා ඉමාම් තුමාට සහාය වූහ.

ඉමාම් අබූ හනිෆා රහ්මතුල්ලාහි අලෛහි තුමන් විසින් පිහිටුවන ලද 'හනෆි මද්හබ්' අද ලෝකයේ විවිධ ප්‍රදේශවල පැතිර ගොස් ඇත. විශේෂයෙන් ඉන්දියාව, පකිස්තානය, ඇෆ්ගනිස්තානය, තුර්කිය වැනි රටවල බහුතර මුස්ලිම්වරු මෙම මද්හබ් අනුව තම ආගමික කටයුතු ඉටුකරති.

ඉස්ලාමීය ඉතිහාසයේ උමයියාවරුන්ගේ පාලන යුගය අවසන් වී අබ්බාසිය යුගය ආරම්භ වූ කාල වකවානුව ඉමාම් අබූ හනීෆා තුමන් ජීවත් වූ කාලයයි. ඉමාම් තුමාට දඬුවම් දීමට සැලසුම් කළ අබ්බාසිය රජය, සිරියාවේ "බයිතුල් මාල්" (භාණ්ඩාගාරයේ) නිලධාරියා වශයෙන් එතුමාව පත් කළේ ය. එම තනතුර බාරගැනීම ඉමාම් තුමා ප්‍රතික්ෂේප කළ නිසා, රජයේ දඬුවමට භාජනය වූයේ ය. ඉන් පසුව ද කූබාවේ විනිශ්චය කාරවරයා ලෙස පත්කරනු ලැබූ විට, එයට ද එකඟ වූයේ නැත. අවසන් වරට ඉරාකයේ විනිසුරු වරයා ලෙස පත්කළ අවස්ථාවේ එය ද ප්‍රතික්ෂේප කළ නිසා එතුමාට සිර

දඬුවම් නියම කරන ලදී. හිජ්රි 150 වර්ෂයේ බන්ධනාගාරයේ දී වස දී ඝාතනය කරනු ලැබුවේ ය.

ඉමාම් අබූ හනීෆා තුමාගේ මරණය ගැන බස්රා ඉමාම්වරයාට ආරංචි වූ විට එතුමා "කූෆා ප්‍රදේශය අන්ධකාරයේ ගිලී ගියේ ය." යයි පැවසුවේ ය. එසේ ම ඉබ්නු ජුරෙයි නම් විද්වතෙක්, "ශ්‍රේෂ්ඨ වූ විශාරදයෙක් අප අතරින් වෙන් වූවා" යයි ශෝක පණිවුඩයක් නිකුත් කළේ ය.

### ක්‍රියාකාරකම්

කණ්ඩායම්වලට බෙදී, කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස, ඉමාම් අබූ හනීෆා පිළිබඳ හා හනෆි මද්හබ් පිළිබඳ වැඩි දුර කරුණු සොයා ඒවා ගොනු කරන්න. ගොනු කළ කරුණු පංතියට ඉදිරිපත් කරමින් ඒ ගැන සාකච්ඡා පවත්වන්න.

## II ඉමාම් මාලික් රහ්මතුල්ලාහ් අලෛහි

"ෆික්හ්", නම් නීති කලාව පෝෂණය කළ තවත් නීති විශාරදයෙක් වූයේ ඉමාම් මාලික් රහ්මතුල්ලාහ් අලෛහි තුමන් ය. මෙතුමාගේ නීති ග්‍රන්ථයට අනුව තම ආගමික කටයුතුවල යෙදෙන මුස්ලිම්වරුන් "මාලිකි මද්හබ්", යනුවෙන් හඳුන්වයි.

හිජ්රි වර්ෂ 95 දී මදීනා නගරයේ උපත ලැබූ එතුමාගේ පියාගේ නම අනස්ය. මූලික අධ්‍යාපනය තම පියා, පියාගේ සොහොයුරන්ගෙන් හා මුත්තාගෙන් ලැබුවේ ය. පසුව වැඩිදුර අධ්‍යාපනය ඉමාම් රෆීඊ රහ්මතුල්ලාහි අලෛහි, ඉමාම් සුහ්රි, ඉමාම් ජහ්ෆර් සාදික් වැනි අයගෙන් ලබාගත්තේ ය. කුඩා කල පටන්ම අති දක්ෂතාවයන් පෙන්නුම් කළ නිසා තරුණ වියේදී ම ගුරුවරයෙකු ලෙසත් පත්කරනු ලැබුවේ ය. ඉමාම් රාෆීඊ තුමාගේ අභාවයෙන් පසු එම පාසල භාරව කටයුතු කරමින් එය උසස් තත්වයේ අධ්‍යාපන ආයතනයක් බවට සංවර්ධනය කිරීමට මෙතුමා සමත් විය.

කලීෆාට හෝ රජයේ උසස් බලධාරින්ට හෝ හිස නොනමන නිර්භීත වුද උසස් චේතනා සහිත වූ ද අවංක පුද්ගලයෙකු වූ ඉමාම් මාලික් තුමා, අධ්‍යාපනය සඳහා තමන් වෙත පැමිණෙන සියලු දෙනාම ඉතා ගෞරවයෙන් පිළිගත්තේ ය. එතුමාගේ අධ්‍යාපන ආයතනය රාජ සභාවටත් වඩා ගරුත්වයෙන් හා භක්තියෙන් පිරුනු ස්ථානයක් විය.

මහජනයා විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා වේලාවන් එතුමා වෙන්කර ගෙන සිටියේ ය. 'මුවත්තා' යන නමින් වූ හදීස් ග්‍රන්ථය මාලික් ඉමාම් තුමාණන් මුස්ලිම් ලොවට දයාද කළ ප්‍රථම ග්‍රන්ථයයි. ඉමාම් තුමා හදීස් 17000 කින් තෝරා ගත් හදීස් අටසීයක් ග්‍රන්ථාරූඪ කිරීමෙන් එම ග්‍රන්ථය සකස් කළේ ය.

මෙම ග්‍රන්ථය ගැන ඉමාම් ෂාෆිඊ තුමන් පවසා ඇත්තේ "කුර්ආනය" හැරුනු විට වඩාත් නිවැරදි ග්‍රන්ථය මෙය" බවයි. එහි හදීස් පමණක් නොව නීතියට අදාළ කරුණු ද ඇතුළත් වී තිබෙන නිසා, ඉස්ලාමීය නීතිය පිළිබඳ ග්‍රන්ථයක් ලෙස ද මෙය සලකනු ලැබේ.

මීට අමතර ව, අල්කුර්ආනය පිළිබඳව හා හදීස් පිළිබඳව ග්‍රන්ථ රාශියක් ඉමාම් මාලික් තුමන් විසින් රචනා කර ඇත. කලීෆා හාරුන් අල් රෂීද් තුමා, බැග්ඩෑඩයේ පිහිටි රජ මාලිගයට පැමිණ "මුඅත්තා", ග්‍රන්ථය කියවා පෙන්වන ලෙසට ඉමාම් තුමාට අණ කළේ ය. ඉමාම් තුමා එය තරයේ ප්‍රතික්ෂේප කරමින් "මිනිසා දැනුම සොයා යාම මිස මිනිසා සොයා දැනුම නොයයි." යන පණිවුඩය කලීෆා වෙත යැව්වේ ය. ඉන්පසු කලීෆා සහ පොදු ජනතාව ඉමාම් තුමා වෙත පැමිණ අධ්‍යාපනය හැදෑරීමට පටන් ගත්හ.

අබ්බාසිය පාලකවරුන්ගෙන් එල්ල වූ හිරිහැරවලට ඉමාම් අබූ හනීෆා තුමන් මෙන් ම, ඉමාම් මාලික් තුමාට ද මුහුණ දෙන්නට සිදු විය. ඉස්ලාමීය ෂරීආ අනුව, ඉමාම් මාලික් තුමා විසින් දෙන ලද යම් යම් ෆත්වා තීන්දු නිසා කෝපයට පත් කලීෆා, ඉමාම් තුමාට දඬුවම් වශයෙන් කස පහර 70 ක් නියම කළේ ය. මෙම කස පහරවලින් පසු ඉමාම්තුමා පංති පැවැත්වීම හැර, අනෙකුත් සියලු කාර්යයන්ගෙන් වැළකී සිටියේ ය. නොබෝ දිනකින් රෝගාතුර වී හිජ්රි 179 වර්ෂයේ දී ඉමාම් මාලික් තුමා අභාවප්‍රාප්ත වීමෙන්, මදීනා නගරයේ ජන්නතුල් බකී හි භූමිදානය කරනු ලැබුවේ ය.

ඉමාම් මාලික් තුමන් පිළිබඳව ඉමාම් අබූ හනීෆා තුමා, "කුර්ආනය, හදීස් යන දෙකම දන්නා අය අතරින් ඉමාම් මාලික්ට වඩා ප්‍රවීණයෙකු මම නොදුටුවෙමි". යයි පැවසුවේ ය. මාලිකී මද්හබ් අනුගමනය කරන්නෝ ඇල්ජීරියාව, මොරොක්කෝව, ටියුනීසියාව වැනි උතුරු අප්‍රිකානු රටවල වැඩිපුර සිටිති.

## ක්‍රියාකාරකම්

1. හදීස් කලාවට හා ෆික්හ් කලාවට ඉමාම් මාලික් තුමා ඉටුකළ සේවය අගය කරමින් රචනයක් ලියන්න.

## III ඉමාම් ෂාෆිඊ රහ්මතුල්ලාහි අලෛහි

නැගෙනහිර ආසියානු රටවල විශාල බහුතරයක් අනුගමනය කරන ෂාෆිඊ මද්හබයේ නිර්මාතෘවරයා ඉමාම් ෂාෆිඊ රහ්මතුල්ලාහි අලෛහි තුමා ය. මුහම්මද් යන නමින් හිජ්රි 150 වර්ෂයේ දී පලස්තීන දේශයෙහි උපන්නේ ය. පියාගේ නම ඉද්රීස් ය. මී මුත්තාගේ ෂාෆිඊ යන නම එතුමාට හිමි විය. "ආලිමුල් කුරෙෂ්" යන ගෞරව නාමයෙන් ද හඳුන්වනු ලැබුවේ ය.

මවගේ රැකවරණය යටතේ කුර්ආනය මුළුමනින් කට පාඩම් කළේ ය. පුතාගේ දක්ෂතාවය හා උනන්දුව දුටු මව මක්කා නගරයට යවා එහි බාප්පාගේ උදව්වෙන් අධ්‍යාපනය ලැබීමට සැලසුවාය. එහි දී මුස්ලිම් ඉබ්නු හාලිද් නම් වූ මහාචාර්යවරයා ගෙන් උසස් අධ්‍යාපනය ලබා ගැනීමට ප්‍රිය කළ ද දුගීකම නිසා පංති කාමරයට ඇතුළුවීමට නොහැකිව, දෙරටුව අසල වාඩි වී සවන් දීම තුළින් ඉගෙන ගත්තේ ය. ගුරුවරයා නොපැමිණි අවස්ථාවල්වල එහි සිටි ශිෂ්‍යයන්ට වැඩි විස්තර ලබා දීමේ හැකියාව දුටු මහාචාර්යවරයා සිය පංතියට මුදල් නොගෙවා සහභාගීවන ලෙස අණ කළේ ය. සිය විවේක කාලයේ දී ගුරුතුමාට සේවය කළේ ය. මෙතුමාගේ දක්ෂතාවය අවබෝධ කරගත් ආචාර්යවරයා ඉමාම් තුමාගේ තරුණ වයස ගැන නොතකා ආගමික ප්‍රශ්නවලදී තීන්දු ලබාදෙන "මුෆ්ති" කෙනෙකු ලෙස කටයුතු කිරීම සඳහා අනුමැතිය දුන්නේ ය.

එකල මදීනා නගරයේ ඉමාම් මාලික් තුමාණන් විසින් පවත්වාගෙන යන ලද අධ්‍යාපන ආයතනය පිළිබඳ තොරතුරු ලැබීමෙන්, එහි ගොස් ෆික්හ් හදීස් සහ ඉතිහාසය පිළිබඳ අධ්‍යාපනය ලැබුවේ ය.

පසුව කලීෆා විසින් යේමන් දේශයේ ආණ්ඩුකාර ධූරයට පත්කරනු ලැබුවේ ය. එහි දී අවංකව සේවය කළ නමුත් කුමන්ත්‍රණ කාරයින්ගේ බොරු චෝදනා හේතුවෙන් අත් අඩංගුවට පත් විය.

පසුව ඉමාම් තුමාගේ නිර්දෝෂී බව ඔප්පුවීමෙන් පසු නිදහස් කළේ ය. සිදු වූ වරද ගැන කලීෆා මෙතුමාගෙන් සමාව අයැද සිටි නමුත් ආණ්ඩුකාර ධූරය නැවත බාර ගැනීම ප්‍රතික්ෂේප කළ ඉමාම් ෂාෆිඊ, මක්කා නගරයට ගොස් එහි අධ්‍යාපන ආයතනයක් පවත්වා ගෙන ගිය අතර මුෆ්ති කෙනෙකු වශයෙන් ද සේවය කළේ ය.

හදීස් කලාව, ඉස්ලාමීය නීති සම්පාදනය යන ක්ෂේත්‍රවල මෙන් ම අරාබි සාහිත්‍යය, ව්‍යාකරණය වැනි විෂයයන්වල ද ප්‍රවීණතාවක් ඉමාම් ෂාෆිඊතුමා අත්කරගෙන සිටියේ ය. අරාබි ගද්‍ය සාහිත්‍යයට අගනා ග්‍රන්ථ රාශියක් එකතු කිරීමෙන් විශාල දායකත්වයක් ද ලබා දුන්නේ ය.

නොයකුත් විෂයයන් පිළිබඳ ග්‍රන්ථ 113 ක් ඉමාම් ෂාෆිඊ තුමන් විසින් ප්‍රකාශයට පත් කර ඇත. ඉස්ලාමිය ෂරීආ නීතිය පිළිබඳ පමණක් පොත් 14 ක් රචනා කළේ ය.

ඒ අතරින් "කිතාබුල් උම්මු" නමැති ග්‍රන්ථය මිල කළ නොහැකි අගනා නීති පොතක් ලෙස සැලකේ. කාණ්ඩ 15 කින් යුතු මෙම පොත, අඳුරට පහනක් සේ නීතිය හදරන්නන්ට ආලෝක ධාරාවක් ලෙස සැලකේ. එමෙන් ම 'අර්රිසාලා' නම් ග්‍රන්ථය මූලාශ්‍රවලින් නීතිය උපුටා ගෙන ඇති 'උසූලුල් ෆික්හ්' කලාවේ සැලකිය යුතු ග්‍රන්ථයකි. එසේම හදීස් කලාව සම්බන්ධයෙන් අල් මුස්නද් ග්‍රන්ථය ඉමාම් ෂාෆිඊ තුමන්ගේ වැදගත් නිර්මාණයකි. තවත් එතුමා ගේ වැදගත් ග්‍රන්ථ කිහිපයක් පහත දැක්වේ.

1. **කිතාබුල් උම්මු**
2. **අර්රිසාලා**
3. **අල් මුස්නද්**
4. **කිතාබු ඉඛ්තිලාෆුල් අහාදීස්.**
5. **ජිමාඋල් ඉල්ම්**
6. **අහ්කාමුල් කුර්ආන්**

මුලින් නිර්මාණය වූ හනෆි සහ මාලිකී මද්හබ් ග්‍රන්ථ දෙක සමග සසඳ බලන විට ඒවායින් ෂාෆිඊ මද්හබ් වෙනස් වීම විශේෂ ලක්ෂණයකි. හදීස්වලටත් සිය බුද්ධියටත් මුල් තැන දෙමින් මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් ඉමාම්තුමා තම අදහස් බොහොමයක් පළ කර ඇත. කලීෆා හාරූන් අල් රෂීද් තුමාගේ අභාවයෙන් පසු, ඉමාම් ෂාෆිඊ තුමා ඊජිප්තු රට බලා පිටත්ව ගියේ ය. එහිදී හිජ්රි වර්ෂ 204 දී අභාවප්‍රාප්ත වූයේ ය.

"කුරෛෂි පරම්පරාවෙන් විද්වතෙක් බිහිවී ලොව සතර දිසාවම තම දැනුමෙන් පුරවයි" යනුවෙන් වරක් නබි තුමා කළ ප්‍රකාශයෙන් කිය වෙන්නේ ඉමාම් ෂාෆිඊ තුමා ගැන බව බොහෝ දෙනාගේ අදහස වේ.

**ක්‍රියාකාරකම්**

1. ඉමාම් ෂාෆිඊ තුමාගේ ජීවිත කතාව කෙටියෙන් ලියා දක්වන්න.
2. ලේඛකයෙකු වශයෙන් ඉමාම් ෂාෆිඊ තුමාණන් ඉටු කළ සේවය විග්‍රහ කරන්න

## IV ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් රහ්මතුල්ලාහි අලෛහි

මුස්ලිම් ජනතාව විසින් අනුගමනය කරනු ලබන "හන්බලි මද්හබ්" නම් තවත් සංකල්පයක නිර්මාතෘ ඉමාම් හන්බල් තුමා ය. හිජ්රි වර්ෂ 164 දී බැග්ඩෑඩ් නගරයේ මෙතුමා උපත ලැබුවේ ය. මුහම්මද් යනු පියාගේ නමයි. මුත්තාගේ හන්බල් යන නම ඉමාම් තුමාට උරුම විය. මෙතුමා ජීවත් වූ එම කාලය අබ්බාසිය පාලන කාලය විය. කලීෆා අල් මහ්මූන්ගේ පාලන කාලයේ දී සහ ඉන්පසුව එළඹුණු කලීෆා අල් මුහ්තසීම් ගේ පාලන සමයේ ඉමාම් අහ්මද් තුමාගේ ආගමික සේවය මුස්ලිම් ලොවට ලැබී ය. ඉස්ලාමීය ප්‍රතිපත්තිවලට විරුද්ධ අදහස් දරන්නන් ඉදිරියේ එතුමා නිර්භීතව නැඟී සිටියේ ය.

විශේෂයෙන් මුහ්තසිලාවරුන් ට එරෙහිව ප්‍රතිපත්තිමය සටනක් දියත් කිරීමට ඉමාම් තුමාට සිදු විය. කලීෆා මහ්මූන්ගේ පාලන කාලයේ මුහ්තසිලාවරු ඉස්ලාමී විරෝධී ප්‍රතිපත්තීන් පතුරුවන්නට පටන් ගත් අතර, ආගමික නීති රීති හා නියමයන් විවේචනයට ලක් කරමින් ඒවා තාර්කිකව පරීක්ෂා කරන්නට වූහ. "කුර්ආනය නිර්මාණ කරන ලද්දක් ; එම නිසා එය නැති වී යන දෙයක්" යනුවෙන් තර්ක කළ ඔවුන්ට එරෙහිව ඉමාම් අහ්මද් තුමා, බිඳිය නොහැකි තර්ක ඉදිරිපත් කරමින් සත්‍යය වෙනුවෙන් පෙනී සිටියේ ය. එවකට මෙම මුහ්තසිලාවරුන්ගේ ප්‍රතිපත්තීන් රාජ්‍ය ප්‍රතිපත්ති ලෙස ද ප්‍රකාශයට පත් කර තිබුණි. ඒ නිසා එම ප්‍රතිපත්තීන් වලට විරුද්ධව කතා කළ ඉමාම් තුමන් කලීෆා මුහ්තසිම් විසින් සිර බාරයට ගනු ලැබුවේ ය. දඬුවමක් වශයෙන් කස පහර 1000 ක් ද නියම කළේ ය. එහෙත් රාජ්‍ය බලයට හෝ දඬුවම්වලට එතුමා හිස නැමුවේ නැත. "ඉස්ලාම් ධර්මය මරණයට පත් වී මා ජීවත් වීමට වඩා ඉස්ලාම් ධර්මය ජීවත් කරවීම මට උතුම් ය" යයි ප්‍රකාශ කළ ඉමාම් තුමා සිය ජීවිතය පරිත්‍යාග කළේ ය.

මූලික අධ්‍යාපනය බැග්ඩෑඩ් වල දී ලබාගත් ඉමාම් අහ්මද්තුමා වැඩිදුර අධ්‍යාපනය ලැබුවේ ඉමාම් ෂාෆිඊ තුමාගෙන් ය. දිගු කලක් එනම් ඊජිප්තුව බලා පිටත්වන තුරු ඉමාම්ෂාෆිඊ තුමාගෙන් අධ්‍යාපනය ලැබුවේ ය. හදීස් එක්රැස් කිරීමත්, විද්වතුන් හමුවීමත් අරමුණු කරගෙන කූෆා, බස්රා, මක්කා, මදීනා, සිරියා යනා දී නගරවල සංචාරය කළේ ය. ලක්ෂ 7½ කින් හදීස් තිස් දහක් පමණක් තෝරාගෙන, ඒවා ග්‍රන්ථාරූඪ කිරීමෙන් " මුස්නද් අහ්මද්" නම් හදීස් ග්‍රන්ථය පළ කළේ ය.

ඉමාම් බුහාරි, ඉමාම් මුස්ලිම් යන දෙදෙනාගේ ම ගුරුවරයා වශයෙන්, හදීස් එක්රැස් කිරීමෙහි ආදර්ශය හා මග පෙන්වීම ඉමාම්වරුන් දෙපළට ම ලබා දුන්නේ ය. ප්‍රථමයෙන් හදීස් කලාව වෙත අවධානය යොමු කළ ඉමාම්තුමා, පසුව යුගයේ අවශ්‍යතාවය නිසා නීති කලාව වෙත ද අවධානය යොමු කළේ ය.

ඉජ්තිහාද් පදනම් කොටගෙන ජනතාව නිසි මග පෙන්වා දෙන මද්හබ් ක්‍රමයක් හඳුන්වා දීම අත්‍යවශ්‍ය බව ඉමාම් අහ්මද් තුමා හොඳින් වටහා ගත්තේ ය. එහි ප්‍රතිඵලය වූයේ හන්බලි මද්හබය බිහිවීම ය. තම ජීවිත කාලයම ඉස්ලාම් ධර්මය වෙනුවෙන් කැප කළ ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් තුමා හිජ්රි 241 දී බැග්ඩෑඩ් හි අභාවප්‍රාප්ත වූයේ ය.

- "මසාඉල් සාලිහ්"යනු ඉමාම් හන්බල් තුමා ගේ ෆික්හ් (නීති) ග්‍රන්ථයකි. නීතිය සම්බන්ධයෙන් එතුමා ගෙන් විවිධ අය ඇසූ ප්‍රශ්නවලට දෙන ලද පිළිතුරුවල එකතුවයි මෙම ග්‍රන්ථය
- "මුස්නද් අහ්මද් " මෙය හදීස් 40,000 ක එකතුවයි.

### ක්‍රියාකාරකම්

1. ෆික්හ් නමැති ඉස්ලාමීය නීති ක්ෂේත්‍රයට ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් තුමාගෙන් ඉටුවූ සේවය විස්තර කරන්න.

## 6.3 අපරාධ හා දඬුවම්

මෙම පාඩම ඉගෙනීමෙන් ඔබ
1. අපරාධ යනු මොනවාදැයි නිර්වචනය කරයි.
2. අපරාධ හඳුනාගෙන ඒවායේ දඬුවම් ගැන අවබෝධ කර දෙයි.
3. අපරාධවලින් තොර සමාජයක් බිහි කිරීමට දායක වේ.

ඉස්ලාම් ආගම අනුව අපරාධය යන්නට දෙන නිර්වචනය වන්නේ අපරාධය යනු, "අල්ලාහ් විසිනුත් රසූලුල්ලාහ් විසිනුත් අපරාධ ලෙස පෙන්වා දෙන ලද ක්‍රියාවල, වැඩිවියට පත්, සිහි බුද්ධිය ඇති යමෙකු නිරතවීම" ය.

නිදසුනක් වශයෙන් මත්පැන් භාවිතය හා සොරකම තහනම් බව කුර්ආනය පවසයි. වැඩිවියට පත් සහ සිහි බුද්ධිය ඇති මුස්ලිම් කිසිවෙක් මෙම ක්‍රියාවේ නිරත වුවහොත් ඉස්ලාමීය දෘෂ්ඨි කෝණයෙන් එය අපරාධයකි. ඒ වෙනුවෙන් දිය යුතු දඬුවම් ද නියම කර ඇත.

"නියත වශයෙන් ම මිනිසා දුර්වල කෙනෙකු ලෙස මවනු ලැබ ඇත" යනුවෙන් කුර්ආනයේ අල්ලාහුතආලා විසින් පවසා ඇත. එහෙත් දුර්වල වූ මිනිසාට තමාගේ චිත්ත වේගයන්, ආශාවන් සහ ක්‍රියාවන් පාලනය කර ගැනීමේ ශක්තිය ද ඇත. මෙසේ තමන් ව පාලනය කර ගැනීමේ ශක්තිය භාවිත කිරීම මඟින් අපරාධ වලින් වැළකී සිටීම සඳහා මග පෙන්වීම හා ඒ තුළින් සමාජයෙන් අපරාධ තුරන් කිරීම, ඉස්ලාම් ආගමේ ප්‍රධාන අරමුණකි.

දිගු කාලීනව අපරාධවල යෙදී සිටින්නන් පවා උපදේශනය හා මාර්ගෝපදේශනය නිසි ලෙස ලැබීමෙන් අපරාධවලින් මිදී, උතුම් ගති ගුණ ඇති පුද්ගලයින් බවට පත්වීම ද දැකිය හැකි ය. කෙසේ වුවද අපරාධ කරුවන්ට නිසි දඬුවම් දීම මඟින් අපරාධ අවම කළ හැකි බව ඉස්ලාම් ආගමේ ස්ථාවරය වේ.

මෙහි දී අපරාධ අවම කිරීමේ අරමුණින් ඉස්ලාම් නියම කර ඇති දඬුවම් කිරීමේ ක්‍රම මොනවාදැයි බලමු. ඉස්ලාමීය දඬුවම් ඉතාමත් කුරිරු ඒවා බවත්, මිනිස් සංස්කෘතියට නොගැළපෙන ඒවා බවත් දෙස් පැවරීම අද සුලභව දැකිය හැකි ය. මෙවැනි දෝෂාරෝපණ නගන්නේ කරුණු දෙස ගැඹුරට අධ්‍යයනය නොකරමින් සහ ඉස්ලාමීය ෂරීඅත් කෙරෙහි ඇති කරගත් ඊර්ෂියාව මත බව රහසක් නොවේ. මෙසේ විවේචනය කරන පාර්ශවය විශේෂයෙන්, සොරකමට අත කැපීම, ලිංගික අපචාරයට ගල් ගැසීම, කස පහර දීම වැනි දඬුවම් දැඩි ලෙස හෙළා දකිති.

**ලිංගික අපචාරයට එරෙහි දඬුවම සම්බන්ධයෙන් කුර්ආනයේ සඳහන් වන්නේ මෙසේය :**

"ලිංගික අපචාරයේ යෙදුනු ස්ත්‍රිය, ලිංගික අපචාරයේ යෙදුනු පිරිමි යන දෙදෙනාගෙන් එක් එක් අයට කස පහර 100 බැගින් ගසනු. සත්‍ය වශයෙන් ම ඔබ අල්ලාහ් ගැනත් ලෝක අවසානය ගැනත් විශ්වාසය කරන්නෙහි නම් අල්ලාහ් නියම

කළ ආඥාව ඉටු කිරීමේ දී ඒ දෙදෙනා කෙරෙහි ඔබට අනුකම්පාව ඇති නොවිය යුතු ය. ඒ දෙදෙනාට දඬුවම් ලෙස වේදනාව දෙන අවස්ථාවේ දී විශ්වාස කරන්නන් (මුඃමින්) පිරිසක් එයට සාක්ෂි දරන්නන් ලෙස එහි සිටින්න" (අල්කුර්ආන් 24:2)

අපහාස කරන්නන්ට දෙන දඬුවම සම්බන්ධයෙන් ද මෙසේ සඳහන් කර ඇත.

"කවුරුන් හෝ කුල ස්ත්‍රියක් ගැන අපහාසයක් කියා, ඊට අවශ්‍ය සාක්ෂි කරුවන් 4 දෙනෙකු ඉදිරිපත් නොකරන්නේ නම් ඔවුන්ට කස පහර 80 ක් ගසනු. පසුව ඔවුන් කියන සාක්ෂි කිසි කලක පිළිනොගනු. මන්ද යත්, ඔවුහු නිශ්චය වශයෙන් ම ආඥා කඩ කළ අය වෙති." (අල්කුර්ආන් 24:4)

මෙලෙස අපරාධවලට අදාළ දඬුවම් කවරේදැයි නිශ්චිත වශයෙන් සඳහන් කරන කුර්ආනය ක්ෂණිකව දඬුවම් ඉටු කරන ලෙස හෝ, පරීක්ෂණ නොපවත්වා දඬුවම් දෙන ලෙස හෝ කියන්නේ නැත. නඩුව දීර්ඝ ලෙස විභාග කොට, සියලු ම සාක්ෂි කරුවන්ගෙන් ප්‍රශ්න කර, සැකයෙන් තොරව ඔප්පු වුවහොත් පමණයි දඬුවම් දිය යුතු බව තදින් ම පවසා තිබෙන්නේ. අපරාධයේ නිරත වීමට තුඩුදුන් හේතුව මෙන් ම අපරාධය සිදුවූ පසුබිම ද සැලකිල්ලට ගත යුතු බව කුර්ආනයේ සඳහන් වේ.

| | |
|---|---|
| නිදසුන 1 : | යමෙක් සොරකම් කිරීමට හේතු වූයේ, මරණයට පත්වන තරම් වූ දැඩි කුස ගින්න බව ඔප්පු වුවහොත් අත කැපීමේ දඬුවම ඔහු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ නොහැකි ය. |
| නිදසුන 2 : | අනාරක්ෂිත ලෙස තබා තිබූ භාණ්ඩයක් හෝ සුළු වටිනාකමකින් යුතු දෙයක් හෝ සොරකම් කළ කෙනෙකු නම් ඔහුගේ ද අත විසන්ධි නොකළ යුතුයි. |
| නිදසුන 3 : | සොරකම් කළ තැනැත්තා සිහිබුද්ධියක් නොමැති කෙනෙක් හෝ වැඩිවියට පත් නොවූ කෙනෙක් නම් ඔහුට අත කපා දැමීමේ දඬුවම නියම කරන්නේ නැත. |
| නිදසුන 4 : | යම් සොරකමක් සම්බන්ධයෙන් යහපත් චරිතයෙන් යුතු දෙදෙනෙකුගේ සාක්ෂිවලින් එය ඔප්පු නොවුන විට ද මෙකී දඬුවම් ක්‍රමය ක්‍රියාත්මක කරනු නොලැබේ. |

ලිංගික අපචාරයේ නිරත වූ දෙදෙනා ම විවාහක පුද්ගලයින් නම් ඔවුන්ව ගල් ගසා මරණ ලෙසට නියම කරන ඉස්ලාම් ආගම, එම අපරාධය සිදුවන අවස්ථාවේ දී එය ඇසින් දුටු, යහපත් චරිතයෙන් යුතු වූ, ඇත්ත කථා කරන හතර දෙනෙකුගේ සාක්ෂි වලින් එය ඔප්පු කිරීම, දඬුවම් දීමට කොන්දේසියක් වශයෙන් දක්වයි.

**සාක්ෂි දීම සඳහා ඉදිරිපත් වන පුද්ගලයින් පිළිබඳව ඉස්ලාමීය නීතියෙහි කොන්දේසි මාලාවක් ඇත. ඒවා නම් :-**

1. සාක්ෂිකරු අව්‍යාජ මුස්ලිම් කෙනෙකු විය යුතුයි.
2. යහපත් චරිතයක් ඇති කෙනෙකු විය යුතු අතර ඔහුගේ චරිතය සම්බන්ධයෙන් සුළු වශයෙන් හෝ සැකයක් නොතිබිය යුතුයි.
3. විත්තිකරු සමඟ කිසිසේත් ම තරහක් හෝ ආරවුලක් නොමැති කෙනෙකු විය යුතුයි.
4. මොනම අවස්ථාවක දී වුවත් අසත්‍යයක්, බොරුවක්, නොකියන කෙනෙකු විය යුතුයි.

ඉහත සඳහන් සුදුසුකම්වලින් යුත් සාක්ෂිවලින් යම් අපරාධයක් ඔප්පු කල නොහැකි වුවහොත්, නිකරුනේ පැමිණිලි කළ අයට කස පහර 80 දෙන ලෙස ඉස්ලාමීය ආගම නියම කරයි. මෙම නියමය නිසා, පුද්ගලික තරහක් හේතුවෙන් හෝ වෙනත් හේතුවක් නිසා හෝ කෙනෙක් තවත් කෙනෙකුට එරෙහිව බොරු පැමිණිල්ලක් කිරීමට හෝ දඬුවමක් ලබා දීමට හෝ තැත් නොකරයි. ඉස්ලාමීය දඬුවම් වල අරමුණ, බියගැන්වීම මඟින් අපරාධ වලින් වැළැකී සිටීමට පෙළඹවීම මිස දඬුවම් වලින් මර්දනය කිරීම නොවේ. අපරාධයක් කිරීමට සිතන තැනැත්තන් අධෛර්යමත් කරමින් ඔවුන් වැරදි මාර්ගයේ යන්න නොදී යහ මාර්ගයේ ගමන් කරවීමටයි, ඉස්ලාමිය දඬුවම් වලින් අපේක්‍ෂා කරන්නේ. එම නිසා ඉස්ලාමීය ආගම යෝජනා කරන මෙම දඬුවම් ක්‍රම නිසි ලෙස ලොව පුරා ක්‍රියාත්මක කළහොත් අපරාධය සිදුවීම අවම මට්ටමක පවතිනවාට කිසිම සැකයක් නැත. උදහරණයක් වශයෙන් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පසුගිය සියවස් 5ක කාලයක් මුළුල්ලේ ම සොරකම වෙනුවෙන් අත විසන්ධි කිරීමේ දඬුවම ක්‍රියාත්මක කර ඇත්තේ දස වතාවටත් අඩුවෙන් ය.

ඒ නිසා මෙවැනි දඬුවම් ක්‍රියාත්මක කිරීම මඟින් අපරාධ හා හිංසාව, අවම වූ උතුම් සමාජයක් බිහි කළ හැකි ය.

ඉස්ලාමීය නීතිය අනුව දඬුවම් ක්‍රම වර්ග තුනකට බෙදු ඇත

**1. අල් හද්** : අල්ලාහ් තආලා සහ රසූලුල්ලාහ්(සල්) පාසින නියම කරන ලද දඬුවම්. මේ වර්ගයේ දඬුවම් වෙනස් කිරීමට හෝ ආදේශ කිරීමට කිසි කෙනෙකුට අනුමැතියක් නැත. මිනීමැරුම්, සොරකම්, ලිංගික අපචාර, අපහාස කිරීම, මත්පැන් භාවිතය, රිද්දත් (ආගම් වෙනස් කිරීම) යන මේ අපරාධ වල නිරත වූවන්ට ක්‍රියාත්මක කළ යුතු දඬුවම් කවරේ ද යන්න අල්ලාහ් සහ රසූලුල්ලාහ් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් විසින් ප්‍රකාශ කර ඇත.

**2. කිසාස්** : පළියට පළි ගැනීමේ ආකාරයේ හෝ වන්දි ගෙවීමේ ආකාරයේ දඬුවම් මේ වර්ගයට අයත් ය. මිනීමැරුමකට ලක් වූ කෙනෙකුගේ ළඟම ඥාතියා කැමැති වූයේ නම් වරදකරුගෙන් වන්දියක් ලබා ගෙන සමාව දිය හැකි ය. ඕනෑ කමින් හෝ අත්වැරුද්දෙන් සිදුවන තුවාල වීම්වල දී මේ ආකාරයේ දඬුවම් නියම කරනු ලැබේ.

**3. තඃසීර්** : සිදුවූ අපරාධයේ ස්වභාවය මත විනිසුරු විසින් නියම කරන දඬුවම්; මෙවැනි දඬුවම් වැඩි වශයෙන් සුළු අපරාධ වලටයි දෙනු ලබන්නේ. අපරාධයේ ස්වභාවය, එයින් ඇතිවූ ප්‍රතිවිපාක, අපරාධයේ පසුබිම වැනි කරුණු සැලකිල්ලට ගනිමින් "ඉජ්තිහාද්" මඟින් දෙනු ලබන දඬුවම් මේ වර්ගයට අයත් ය. මේ දඬුවම් වර්ගය යටතේ එක ම අපරාධයට ඒ ඒ පරිසරයට අනුව දෙනු ලබන දඬුවම වෙනස් වීමට ද ඉඩ ඇත.

| අපරාධය | ඉස්ලාමීය දඬුවම | සටහන |
|---|---|---|
| 1. රිද්දත් (ආගම වෙනස් කිරීම) | මරණ දණ්ඩනය | අවවාදයෙන් පසුවත් පෙරලා ඉස්ලම් ආගමට නොපැමිණිය හොත් |
| 2. මිනී මැරුම් | මරණ දඬුවම හෝ දියත් (වන්දි) | නැසීගිය අයගේ ඥාතියාගේ මනාපය අනුව වන්දි යත් ගෙවා සමාව ලබාගත හැක. |
| 3. ලිංගික අපචාර | කසපහර 100. | අවිවාහක අයනම් |
| | මරණ දඬුවම, ගල්ගසා මැරීම. | විවාහක අයනම් |
| 4. සොරකම | අත කැපීම | කොන්දේසි වලට අනුව පරීක්ෂණයෙන් නිසි ලෙස ඔප්පු වුවහොත් |
| 5. අපහාස | කස පහර 80 | —— |
| 6. මත්පැන් පානය කිරීම | කස පහර 40 | —— |

අපරාධවලට තුඩුදෙන හේතු කාරක වලට තහනම් පමුණුවීම, ඒවා වලක්වාලීමට කටයුතු කිරීම සහ ඒවා සමාජයෙන් තුරන් කිරීම වැනි පියවරවල් ගැනීම මඟින් අපරාධ අවම කිරීමේ ක්‍රමවේද රාශියක් ඉස්ලාම් ධර්මය අපට උගන්වා ඇත.

* සොරකම නැති කිරීම සඳහා සකාත්, සදකා, හිබත් (තෑගි) පොලි නැති ණය ආදිය හඳුන්වා දී තිබීම.
* ලිංගික අපචාරය මැඩලීම සඳහා විවාහය අනිවාර්ය කිරීම හා බහුභාර්යා විවාහයට සහ වැන්දඹු විවාහයට ඉඩ දී තිබීම.
* මත්පැන් භාවිතයෙන් වැළකී සිටීම සඳහා සලාතය, උපවාසය, සහ යහපත් ක්‍රියා සමාජීය සාරධර්ම අනිවාර්යයෙන් ම කළ යුතුව තිබීම.
* ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂය එකට ගැවසීම, ආශ්‍රය කිරීම වැනි දේ තහනම් කිරීම
* කාන්තා පක්ෂය පිරිමින් ඉදිරියේ ෆර්ද ඇඳුමෙන් සැරසී සිටීම අනිවාර්ය කිරීම හා ස්ත්‍රී දේහය ප්‍රදර්ශනය කිරීම තහනම් කිරීම.
* ඉස්ලාමීය පරිසරයක ජීවත්වීමේ අවශ්‍යතාවය පෙන්වා දීම.

**ක්‍රියාකාරකම්**

1. ඉස්ලාමීය දෘෂ්ටි කෝණයෙන් අපරාධය යනු කුමක් දැයි පැහැදිලි කරන්න.
2. දඬුවම්වල වර්ගීකරණය පිළිබඳ විස්තරයක් ලියන්න.
3. ඉස්ලාමීය දඬුවම්වල පරමාර්ථය පිළිබඳ රචනයක් ලියන්න.
4. අපරාධය සිදුනොවීම සඳහා ඉස්ලාම් ආගමෙහි අන්තර්ගත මග පෙන්වීම් මොනවා දැයි විස්තර කරන්න.